# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව

# 2016







# දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා රබර් වගාව හා කර්මාන්තය මෙහෙයවීම

# මෙහෙවර

රබර් වගාව හා කර්මාන්තයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම, රබර් වගාව සඳහා මූල්‍ය සහනාධාර, කෘෂියෙදවුම් හා ව්‍යාප්ති සේවා සැපයීම සහ රබර් කර්මාන්තයේ සංවර්ධනය.

# අරමුණු

- ❖ රබර් වගාබිම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ❖ රබර් වගාබිම් ප්‍රමාණය වැඩි කිරීම.
- ❖ සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වලට රබර් වගාව ව්‍යාප්ත කිරීම මගින් එම ප්‍රදේශවල ජීවත්වන ජනයාට ස්ථිර ආදායම් මාර්ගයක් ලබා දීම.
- ❖ නිම් භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම තුලින් රැකියා අවස්ථා වැඩි කිරීම හා අමු රබර් සඳහා වැඩි අගයක් එකතු කිරීම.
- ❖ ගුණාත්මක අගයෙන් ඉහළ රබර් පැළ සපයා දිම තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම
- ❖ ව්‍යාප්ති සේවා සපයා දීම මගින් රබර් වගාවෙහි තිරසාරත්වය තහවුරු කිරීම.

# පටුන


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 1.1. | ඓතිහාසික පසුබිම | 2 |
| 1.2. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර | 3 |
| 1.3. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 4-5 |
| 1.4. | දෙපාර්තුමේන්තු ආයතනික ව්‍යුහය | 6 |
| 1.5. | සංවිධාන ව්‍යුහය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 7 |
| 1.6. | දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල තොරතුරු | 8 |
| | | |
| 2. | කාර්ය සාධන ප්‍රගතිය 2016 වසර | 9 |
| 2.1. | රබර් වගා සහනාධාර වැඩසටහන | 9 |
| 2.2. | පැළ නිෂ්පාදනය | 10 |
| 2.3. | වැහි ආවරණ යෙදීමේ වැඩසටහන | 10 |
| 2.4. | අතුරු බෝග වැඩසටහන | 10 |
| 2.5. | පුහුණු වැඩසටහන් | 11 |
| 2.6. | සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාකිරීම | 11 |
| | | |
| 3. | ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු 2016 | 12 |
| 3.1. | රබර් වගා බිම් ප්‍රමාණය | 12 |
| 3.2. | රබර් නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම | 13-15 |
| 3.3. | දේශීය රබර් පරිභෝජනය | 16 |
| 3.4. | අමු ද්‍රව්‍යයක් ලෙස ස්වාභාවික රබර් අපනයනය | 16-18 |
| 3.5. | රබර් ආනයනය කළ ප්‍රමාණයන් 2016 වර්ෂය | 18 - 19 |
| 3.6. | රබර් මිල | 19-20 |

| | | |
|---|---|---|
| 3.7. | රබර් වෙළඳුන් | 21 |
| 3.8. | රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය | 21-22 |
| 3.9. | නව වගාව ද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය | 22-27 |
| 3.10. | සහනාධාර ගෙවීම් | 28 |
| 3.11. | රබර් පැළ තවාන් සහ පැළ සැපයීම් | 28 - 30 |
| 3.12. | අතුරු බෝග වගාව | 31 - 32 |
| 3.13. | වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම | 32 -33 |
| 3.14. | රබර් වගාව සඳහා පොහොර සහනාධාර ලබාදීම | 33 - 34 |
| 3.15. | තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයෙ කටයුතු | 35 |
| 3.16. | අන්තර් ජාතික කටයුතු | 35 |
| 3.17. | නෛතික කටයුතු | 35-37 |
| 3.18. | විශේෂ සංවර්ධන වැඩසටහන් | 37 |
| 3.19. | ඒකාබද්ධ අරමුදල | 37 - 38 |
| 3.20. | සෙස් ලැබීම් හා එය අය කරන ආකාරය | 38-39 |
| 3.21. | නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය | 40 |
| 3.22. | අභ්‍යන්තර විගණන කටයුතු | 40 |
| 3.23. | ප්‍රචාරක අංශය මගින් ඉටුකරන ලද කාර්යයන් | 41-42 |
| 3.24. | පරිගණක අංශය මගින් ඉටුකරන ලද කාර්යයන් | 43 |
| 4. | ප්‍රාදේශීය කාර්යාල ප්‍රගතිය | 44 |
| 4.1. | රබර් නව වගා ප්‍රගතිය | 44 |
| 4.2. | රබර් නැවත වගා ප්‍රගතිය | 44 |
| 4.3. | අතුරුබෝග වගා ප්‍රගතිය | 45 |
| 4.4. | වැහි ආවරණ යෙදීම | 45 |
| 4.5. | කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන | 46 |
| 4.6. | කිරිකැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන | 46 |
| 4.7. | බද්ධකරුවන් පුහුණු වැඩසටහන | 47 |
| 5. | අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම | 48 |

# පෙරවදන

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2010 වසරේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයෙන් ලැබුණු තොරතුරු පාදක කරගෙන 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත මුළු රබර් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 136274 ක් වේ. එම බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 87996 ක් කුඩා රබර් වතු අංශයට ද, හෙක්ටයාර 48278 ක් වතු සමාගම් සඳහා ද අයත්වේ. වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 79099 ක් වු අතර මෙය පෙර වර්ෂය සමඟ සැසඳීමේ දී 11% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මුළු රබර් නිෂ්පාදනයෙන් 50% ක් ෂීට් රබර් වන අතර 26% ක ප්‍රතිශතයක් රබර් කිරි නිෂ්පාදනය හා 19% ක ප්‍රතිශතයක් ක්‍රේප් රබර් නිෂ්පාදනයට හා 5% ක ප්‍රතිශතයක් බ්ලොක් රබර් නිෂ්පාදනය සඳහා ද වෙන් වී ඇත. මුළු රබර් නිෂ්පාදනයෙන් 20% අපනයනය කර ඇති අතර 80% දේශීය කර්මාන්තකරුවන් විසින් පරිභෝජනය කර තිබේ. පකිස්තානය, මැලේසියාව, ජපානය, ජර්මනිය, ඉතාලිය, ඇමරිකාව, ඉන්දියාව, චීනය, අමු රබර් මිලදී ගන්නා ප්‍රධාන රටවල් වන අතර එම රටවල් මිලදී ගත් රබර් ප්‍රමාණය මුළු අපනයන ප්‍රමාණයෙන් 75 % කි. 2016 වර්ෂයේ ෂීට් රබර් කිලෝ ග්‍රෑම්1 ක සාමාන්‍ය මිල රුපියල් 238.97 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා 3% ක මිල පහළ යෑමක් විය.

රජයේ මැදිහත්වීම මත රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද පියවරයන් රබර් කර්මාන්තයේ දියුණුවට බොහෝ දුරට ඉවහල්වී ඇත. 2016 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 1479.32 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රුපියල් මිලියන 1162.64 ක වියදමක් දරා ඇති අතර ප්‍රගතිය 79% ක් විය. රජයේ තවාන්වල වසරේ පැළ නිෂ්පාදනය මිලියන 1.20 ක් වූ අතර බෙදාහැරි ප්‍රමාණය පැළ මිලියන 1.04 ක් විය.

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ මොණරාගල, බදුල්ල, අම්පාර හා හම්බන්තොට ප්‍රදේශවලට ද, නව රබර් වගාව ආරම්භ කිරීමට 2011 වසරේදී ආරම්භ කරන ලද කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම 2016 වසරේදී ද සිදුකරන ලදී.

මෙසේ 2016 වසරේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා නන්අයුරින් සහාය ලබාදුන් සැමට මාගේ ස්තුතිය පුද කරමි.

ආර්. බී. ප්‍රේමදාස
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# ස්තූතිය

මෙම 2016 වර්ෂය භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදනය කොට තිබූ මුදලින් 79% ක මූල්‍යමය ප්‍රගතියක් ලබා ගැනීමට හැකි වූ සුවිශේෂී වසරක් විය. මෙම මුදල් ආයෝජනය කිරීම මගින් රබර් වගාවේ සංවර්ධන කටයුතු දිරිමත් කිරීම, මානව සම්පත් වැඩි දියුණු කිරීම හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම සිදු කොට ඇත. සේවක පුහුණුව හා ඵලදායිතාව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සේවක අභිප්‍රේරනය සහ තෘප්තිමත් කාර්ය පරිසරයක් නිර්මාණය කිරීමට හැකිවූ අතර එමගින් කාර්‍යක්ෂම සේවාවක් ලබා දීමට හැකි වීම.

කෙසේ නමුත් මූල්‍ය හා භෞතික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට විවිධාකාරයෙන් සහයෝගය ලබාදුන් කාර්ය මණ්ඩලයේ සියළු දෙනාට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

ආර්.බී. ප්‍රේමදාස
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# 1. හැඳින්වීම

දශක ගණනාවක සිට ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන ආර්ථික වැවිලි බෝගයක් ලෙසට රබර් වගාව මෙරට ආර්ථිකයට ශක්තිමත් දායකත්වයක් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක දහ  හතරක රබර් වගාව ව්‍යාප්ත වී ඇති අතර මේ වන විට මුලතිව්, වවුනියාව, පොළොන්නරුව හා අනුරාධපුර යන දිස්ත්‍රික්ක වලටද රබර් වගාව හඳුන්වා දී ඇත.

## ශ්‍රී ලංකාවේ රබර් වගාකරනු ලබන දිස්ත්‍රික්ක



## 1.1. ඓතිහාසික පසුබිම

රබර් ශාකය හෙවියා බ්‍රසියලියන්සිස් *(Havea brasialiensis)* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලැබේ. බ්‍රසීලයේ වැසි වනාන්තර වල ස්වාභාවිකව වැඩුනු මෙම ශාකයෙන් ලබා ගන්නා රබර් කිරි මේ වන විට මුළු මහත් ලෝකයේම නිෂ්පාදන රාශියකට යොදා ගන්නා ස්වාභාවික අමු ද්‍රව්‍යයක් බවට පත්ව ඇත.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ එනම් 1876 වර්ෂයේ "හෙන්රි වික්හෙම්" නැමැති ඉංග්‍රිසි ජාතිකයා මුල්ම රබර් පැළය ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ රෝපණය කරමින් ශ්‍රී ලංකාවට රබර් ගස හඳුන්වා දෙන ලදී. ඉන් වසර 07 කින් පසු ඇරඹුණු රබර් වගාව දකුණු ආසියාව පුරා ව්‍යාප්ත වී රබර් නිෂ්පාදනය, සීඝ්‍රයෙන් ඉහළ ගියේය. ඊට ප්‍රතිලෝමව රබර් මිල පහළ යාම නිසාම මිල ස්ථාවර කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍යයන් විසින් 1922 දී "ස්ටීවන්සන් පටිපාටිය" හඳුන්වා දුනි. නිෂ්පාදන පංගු ක්‍රමයක් හා අළුතින් රබර් වැවීම සීමා කිරීම් සහිතවූ එම පටිපාටියට රබර් වගා කරුවන්ගෙන්ම ඇතිවූ විරෝධය නිසා 1928 දී අත්හිටුවීය. එසැනින්ම නැවත රබර් සැපයුම වැඩිවී මිල පහළ යාමෙන් පසු 1934 දී රබර් කර්මාන්තයට සම්බන්ධිත සියලු රටවල්වල එකඟතාවයෙන් " International Rubber Regulation Agreement " නැමති ගිවිසුම අත්සන් කෙරිණි. ස්ටීවන්සන් පටිපාටියට සමානවූ කොන්දේසි වලින් සමන්විත එම ගිවිසුමේ වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා රබර් වවන රටවල රබර් පාලනය සඳහා රාජ්‍ය ආයතන බිහි කරන ලදී. ඒ අනුව " 1934 දී අංක 06 දරණ ආඥා පනත " මගින් රබර් පාලන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම දෙපාර්තමේන්තුවේ මුල්ම රබර් පාලකවරයා වූයේ පී. සරවනමුත්තු මැතිතුමාය.

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා "1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත" සම්මත කර ගන්නා ලදී. රබර් නැවත වගාවට ඉඩ සැලසෙන අයුරින් "1934 අංක 06 දරණ රබර් පාලන ආඥා පනත" ප්‍රතිශෝධනය කරමින් "1956 අංක 11 දරණ රබර් පාලන පනත" සම්මත කරගත් අතර එම පනත හා "1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත" ට අදාල රාජකාරි රබර් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

රබර් පාලන දෙපාර්තමේන්තුවේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් 1994 වසරේදී එතෙක් පැවති රබර් පාලන දෙපාර්තමේන්තුව අහෝසි කර අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මේ අනුව එතෙක් පැවති රාජකාරි වලට අමතරව රබර් වගා ක්ෂේත්‍රයේ සංවර්ධනයට ඉවහල් වන ව්‍යාප්ති සේවා, පැළ නිෂ්පාදනය හා පොහොර බෙදීම වැනි වඩාත් පුළුල් පරාසයක විහිදුනු සේවාවක් සැපයීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.

තවද මෙම දෙපාර්තමේන්තුවට රබර් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයත්, කුඩා ඉඩම් හිමියන්ට අලෙවි හා ව්‍යාප්ති සේවා ලබා දෙමින් තුරුසවිය අරමුදලත් දායකත්වය ලබා දෙනු ලැබේ.

## 1.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර

### 1.2.1. 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත

මෙම පනත යටතේ රබර් නැවත වගා කිරීම, රබර් නව වගාව, අතුරු බෝග වගාව, කර්මාන්ත ශාලා නවීකරණය යනාදිය සඳහා සහනාධාර කටයුතු ක්‍රියාත්මක වේ. තවද මෙම පනතේ 7 වගන්තිය යටතේ සෙස් බදු පැනවීම සඳහා අවකාශ ලබා දී ඇත.

### 1.2.2. 1956 අංක 11 දරණ රබර් පාලන පනත

රබර් පාලන පනතේ විධි විධාන යටතේ මෙරට පවත්නා සියලුම කුඩා රබර් ඉඩම් හා රබර් වතුවල වගාව, අයිතිකරුවන්, බිම් ප්‍රමාණ ආදිය සටහන් වන ලේඛනයක් පවත්වාගන යෑම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත කාර්යයකි. රබර් පාලන පනත යටතේ රබර් වගාව පවතින අක්කර 10 ට වැඩි ( හෙක්ටයාර 4.04 ට වැඩි ) රබර් වගාවක් "වත්තක් " ලෙසත්, අක්කර 10 ට අඩු (හෙක්ටයාර 4.04 ට අඩු) රබර් වගාවක් "කුඩා ඉඩමක්" ලෙසත් අර්ථකථනය කර ඇත.

### 1.2.3. 2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ( සංශෝධිත ) පනත

2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධිත) පනතට අනුව , දේශීයව පරිභෝජනයට ගන්නා අමු ස්වභාවික රබර් හා කෘත්‍රිම රබර් මත සෙස් බදු අය කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝග ක්‍රියාත්මක වීමට පෙර සෙස් බදු අය කරනු ලැබුවේ අපනයනය කරනු ලැබූ ස්වභාවික අමු රබර් සඳහාය.

2007 අංක 01 දරණ ස්වභාවික රබර් සඳහා වූ සෙස් බදු නියෝග ඇතුලත් 2007 අගෝස්තු 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1518/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අපනයනය හෝ දේශීය පරිභෝජනය සඳහා නිපදවනු ලබන රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අමු රබර් මිලදී ගන්නා අවස්ථාවේදී කිලෝ ග්‍රෑමයකට රු 4 ක සෙස් බද්දක් අය කිරීමට මෙමගින් ප්‍රතිපාදන සලසා දී ඇත.

නිමි භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවා විසින් අමු රබර් මිලදී ගන්නා අවස්ථාවේදී නිෂ්පාදකයාගෙන් අයකර මෙම බදු මුදල රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

## 1.3. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල, ගනහේන, නො.465 දරණ ස්ථානයේ පිහිටුවා ඇත. ප්‍රධාන කාර්යාලය විසින් පරිපාලන, මෙහෙයුම්, සෙස් බදු එක් රැස් කිරීම හා අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි. සහනාධාර ගෙවීම, පැළ නිෂ්පාදනය කර බෙදා හැරීම, පොහොර බෙදා හැරීම හා උපදේශන සේවා වැනි රබර් වගාවේ සංවර්ධනය සඳහා ඉටු කරන සේවාවන් ජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව ලබා දීමේ අරමුණින් එම කටයුතු ප්‍රාදේශීය කාර්යාල 5ක් මගින් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල ප්‍රාදේශීය කාර්යාල මගින් පහත සඳහන් දිස්ත්‍රික්ක ආවරණය කරනු ලබයි.

1. කෑගල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (කෑගල්ල, කුරුණෑගල, මහනුවර, මාතලේ හා ගම්පහ දිස්ත්‍රික්ක සඳහා)
2. කළුතර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (කළුතර දිස්ත්‍රික්කය සඳහා)
3. රත්නපුර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (රත්නපුර හා කොළඹ දිස්ත්‍රික්ක සඳහා)
4. ගාල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා)
5. මොණරාගල ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය
   (මොණරාගල, බදුල්ල හා අම්පාර දිස්ත්‍රික්ක සඳහා)

තවද රබර් වගාව සඳහා ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය සඳහා රජයේ පැළ තවාන් 08 ක් ස්ථාපනය කර ඇත.

1. මීරිගම (ගම්පහ දිස්ත්‍රික්කය)
2. වැලිකඩමුල්ල (ගම්පහ දිස්ත්‍රික්කය)
3. ඇගල් ඔය (කළුතර දිස්ත්‍රික්කය)
4. ගුරුගොඩ (කළුතර දිස්ත්‍රික්කය)
5. කරපිංච (රත්නපුර දිස්ත්‍රික්කය)
6. කුඹුක්කන (මොණරාගල දිස්ත්‍රික්කය)

7. මිද්දෙණිය (හම්බන්තොට දිස්ත්‍රික්කය)

8. පදියතලා (අම්පාර දිස්ත්‍රික්කය)



ගුරුගොඩ රබර් පැළ තවාන



මිද්දෙනිය රබර් පැළ තවාන



කරපිංච  රබර් පැළ තවාන

## 1.4. දෙපාර්තමේන්තු ආයතන ව්‍යුහය



## 1.5. සංවිධාන ව්‍යුහය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව




➤ ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ කාර්යාල - ගාල්ල, රත්නපුර, කෑගල්ල, කළුතර, මොණරාගල

## 1.5. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | දැනට සිටින කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්‍ෂ ජනරාල් - ශ්‍රී ලං.ප.සේ | 1 | 1 | 0 |
| 02 | අධ්‍යක්ෂ - ශ්‍රී ලං.ප.සේ | 2 | 1 | 1 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරි - ශ්‍රී ලං.ග.සේ | 1 | 1 | 0 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ - ශ්‍රී ලංතො.තා.සේ | 1 | 0 | 0 |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ශ්‍රී ලං.ප.සේ<br>සහකාර අධ්‍යක්‍ෂ - ශ්‍රී ලං.ප.සේ | 16 | 14 | 2 |
| 06 | සහකාර අධ්‍යක්‍ෂ - ශ්‍රී ලං.කෘ.සේ | 1 | 1 | 0 |
| 07 | ගණකාධිකාරි - ශ්‍රී ලං.ග.සේ | 6 | 4 | 2 |
| 08 | සහකාර අධ්‍යක්‍ෂ -ශ්‍රී ලං. තො.තා.සේ | 2 | 1 | 1 |
| 09 | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 10 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි - ශ්‍රී.ලං.තො හා සන්.තා.සේ | 2 | 0 | 2 |
| 11 | විගණක ලිපිකරු | 1 | 1 | 0 |
| 12 | පරිපාලන නිලධාරි | 4 | 3 | 1 |
| 13 | ප්‍රචාරක නිලධාරි | 1 | 1 | 0 |
| 14 | අයවැය සහකාර | 1 | 1 | 0 |
| 15 | සංවර්ධන නිලධාරි | 22 | 18 | 4 |
| 16 | සංවර්ධන සහකාර | 5 | 3 | 2 |
| 17 | තවාන් කළමණාකරු | 7 | 6 | 1 |
| 18 | ගොඩනැගිලි නඩත්තු නිලධාරි | 1 | 1 | 0 |
| 19 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 139 | 115 | 24 |
| 20 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 5 | 2 | 3 |
| 21 | ලිපිකරු/යතුරු ලේඛන | 11 | 11 | 0 |
| 22 | රබර් සංවර්ධන නිලධාරි<br>ව්‍යාපෘති - අධි ශ්‍රේණිය | 12 | 0 | 12 |
| 23 | රබර් සංවර්ධන නිලධාරි | 182 | 146 | 36 |
| 24 | කාර්යාල සේවක සේවය | 28 | 26 | 2 |
| 25 | රියදුරු | 36 | 32 | 04 |
| 26 | ලොරි සහයක | 8 | 8 | 0 |
| 27 | මුරකරු | 01 | 1 | 0 |
| 28 | තේ ශක්ති මණ්ඩලය | | 10 | 0 |
| | එකතුව | 497 | 409 | 97 |

කාර්ය මණ්ඩලය සංඛ්‍යා සටහන i

# 2. කාර්ය සාධන ප්‍රගතිය  - 2016 වසර

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ප්‍රධාන වශයෙන් ඉටු කරන ලදි.

- රබර් වගා සහනාධාර වැඩසටහන
- පැළ නිෂ්පාදනය.
- වැහි ආවරණ යෙදීමේ වැඩසටහන
- අතුරු බෝග වැඩසටහන
- පුහුණු වැඩසටහන්
- පොහොර සහනාධාරය ලබා දීම

## 2.1. රබර් වගා සහනාධාර වැඩසටහන

රබර් නව වගා වැඩසටහන යටතේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල කුඩාවතු සඳහා 2016 වර්ෂයේදී හෙක් 2800 ක ඉලක්කයක් පැවති අතර ඉන් හෙක් 592 ක් වගා කරන ලදී. මෙම හෙක් 592 වගා කිරීම සඳහා සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල කුඩාවතු හිමියන් වෙනුවෙන් රබර් නව වගාව සඳහා සහනාධාර වශයෙන්  රු. මි. 179.90 ක් ගෙවා ඇත.

රබර් නැවත වගා වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 2700  ඉලක්කයක් පැවති අතර හෙක්ටයාර 538 ක් වගා කරන ලදී.  වැව්ලි සමාගම් යටතේ හෙක් 1500 ඉලක්කයක් පැවති අතර හෙක් 336.15 ක්ද වගා කරන ලදී.  ඒ අනුව රබර් නැවත වගාව යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්  874.15 වන අතර ඒ සඳහා සහනාධාර වශයෙන් රු. මි. 337.51 ක් ගෙවා ඇත.



කිරි කපන රබර් වගාවක් - ගාල්ල

## 2.2. පැල නිෂ්පාදනය

දෙපාර්තමේන්තුව මගින් තවාන් 08 ක් ස්ථාපනය කර ඇති අතර ඉන් තවාන් 07 ක් මගින් පැළ නිෂ්පාදනය කර බෙදා හැරීම සිදු කරනු ලබයි. අම්පාර දිස්ත්‍රික්කයේ අළුතින් ස්ථාපනය කර ඇති පදියතලාව පැළ තවානේ පැළ නිෂ්පාදන කටයුතු 2016 වර්ෂය අවසානයේදී ආරම්භ කරන ලදී.

## 2.3. වැහි ආවරණ යෙදීමේ වැඩසටහන

වැහි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 1000 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 182.62 ක් සඳහා වැහි ආවරණ යොදන ලදී. කුඩා වතු සඳහා සහනාධාර වශයෙන් රු. මි. 2.69 ද වැවිලි සමාගම් සඳහා හෙක් 3000 ක ඉලක්කයක් පැවති අතර හෙක්. 2452 ක් සඳහා වැහි ආවරණ යොදා ඇත. සහනාධාර වශයෙන් රු. මි. 20.34 ක මුදලක් වැය කරන ලදී.



වැහි ආවරණ යොදන ලද රබර් ඉඩමක්

## 2.4. අතුරු බෝග වැඩසටහන

අපරිණත රබර් වගාව සමඟ රබර් වගා කරුවන්ට අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා අතුරු බෝග වගා කිරීමේ වැඩසටහන යටතේ හෙක් 830 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 183.50 ක් වගා කරන ලදී. අතුරු බෝග වැඩ සටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 1.20 ක මුදලක් කුඩා රබර් ඉඩම් හිමියන් වෙත ගෙවා ඇත.



රබර් සමග කෙසෙල් වගා කල ඉඩමක්



රබර් සමග අන්නාසි වගා කල ඉඩමක්

## 2.5. පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන් වශයෙන් කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සාමාන්‍ය, වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන හා බද්ධ කරුවන් පුහුණු කිරීම පවත්වන ලදී. කිරි කැපුම් ශිල්පීන් පුහුණු වැඩසටහන යටතේ සාමාන්‍ය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 2520 ක් වූ අතර එයින් 2480 දෙනෙකු පුහුණු කරන ලදී. කිරිකැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණු වැඩසටහන සඳහා රු.මි. 2.06 ක් වියදම් කරන ලදී. වෘත්තීය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 300 වූ අතර මෙම වර්ෂයේදී 305 දෙනෙකු මේ සඳහාද පුහුණු කරවන ලදී. වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සඳහා රු.මි. 2.50 වියදම් කරන ලදී. බද්ධකරුවන් පුහුණු කිරීම සඳහා ඉලක්ක ගත පුද්ගලයින් සංඛ්‍යාව 210 වූ අතර එම සියළු දෙනාම පුහුණු කරන ලදී. බද්ධකරුවන් පුහුණු වැඩසටහන සඳහා රු. මි. 0.19 ක් වියදම් කරන ලදී. රබර් සංවර්ධන නිළධාරීන්ගේ ක්ෂේත්‍ර නිළධාරි පුහුණුව සඳහා ඉලක්ක ගත පුද්ගලයින් ප්‍රමාණය 182 ක් වු අතර සියළු දෙනාම පුහුණුව සඳහා සහභාගි වි ඇත. ඒ සඳහා රු.මි. 2.18 වැය වී ඇත.



කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහනක්



සම්ප්‍රදායික නොවන ප්‍රදේශයක
ඇති රබර් ඉඩමක්

## 2.6. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගා කිරීම

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් නව වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී මොණරාගල හෙක් 197.72 ක්ද අම්පාර හෙක් 212.57 ක්ද, බදුල්ල හෙක් 49.04 ක්ද, හම්බන්තොට හෙක් 6.36 ක්ද වශයෙන් සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල මෙම වසරේදී වගා කරන ලද නව වගා මුළු බිම් ප්‍රමාණය හෙක් 465.69 වේ.

# 3. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - 2016 වසර

පසුගිය වසර කිහිපයේ රබර් වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කෙරේ. 2016 වර්ෂයේ දිවයිනෙහි ඇස්තමේන්තු ගත මුළු රබර් බිම් ප්‍රමාණය 2010 වර්ෂයේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයේ ප්‍රතිඵල පදනම් කොට ගණනය කර ඇත.

## 3.1. රබර් වගා බිම් ප්‍රමාණය

**රබර් වගා බිම් ප්‍රමාණය- 2016 වර්ෂය**

| | පෞද්ගලික අංශය (හෙක්ටයාර් 20 ට අඩු ඉඩම්) හෙක්. | ප්‍රාදේශිය වැවිලි සමාගම් (හෙක්ටයාර් 20 ට වැඩි ඉඩම්) හෙක්. | එකතුව හෙක්. |
|---|---|---|---|
| 2010 වර්ෂයේ රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වූ බිම් ප්‍රමාණය | 79,395 | 46,250 | 125,645 |
| 2011 වර්ෂයේ රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වූ බිම් ප්‍රමාණය | 80,018 | 48,516 | 128,534 |
| 2012 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 82,170 | 48,610 | 130,780 |
| 2013 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 85,083 | 48,585 | 133,668 |
| 2014 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 85,100 | 49,037 | 134,137 |
| 2015 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 87,604 | 48,978 | 136,582 |
| 2016 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 87,996 | 48,278 | 136,274 |

**සංඛ්‍යා සටහන ii**

රබර් වගාව පවතින බිම් ප්‍රමාණයෙන් 65% ක් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් කට්ටි වශයෙන්ද, ඉතිරි 35% ප්‍රමාණය වැවිලි සමාගම් වතු වශයෙන්ද පවතී. මෙම මුළු බිම් ප්‍රමාණයෙන් අපරිණත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 39842 ක්ද, කිරි කපන පරිණත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 96432 ක්ද ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එම වගාවෙන් ලත් මුළු නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 79,099 ක් වේ. 2016 වර්ෂයේ රබර් හෙක්ටයාරයක සාමාන්‍ය වාර්ෂික අස්වැන්න වියලි රබර් කිලෝ ග්‍රෑම් 819 ක් ලෙසද ඇස්තමේන්තු කර ඇත.

## 3.2. රබර් නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම

### 3.2.1. රබර් නිෂ්පාදනය

2016 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 79,099 කි. පෙර වර්ෂයේ මුළු නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 88,567 හා සසඳන විට කිලෝග්‍රෑම් 9,488 ක අඩුවීමක් දක්නට ඇත. එය පෙර වර්ෂය හා සසඳන කල 11% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙලෙස නිෂ්පාදනය අඩු වීමට බල පෑ ප්‍රධාන හේතූන් වන්නේ පසුගිය වර්ෂ කිහිපය තුළ ලෝක රබර් මිල පහළ යාම නිසා අප රටෙහිද රබර් මිල ක්‍රමයෙන් පහළ යාම හා 2016 වර්ෂය මුල් කාලයේදී පැවති අධික වර්ෂාව හා වර්ෂය අග භාගයේ පැවති අධික වියළි කාළගුණික තත්වයයි.

**2015 සහ 2016 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | ස්ක්‍රැප් ක්‍රේප් | සෝල් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් T.S.R | ලේටෙක්ස් සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2015 | 44,392 | 886 | 1,939 | 8,266 | 7,606 | 25,478 | 88,567 |
| 2016 | 39,754 | 791 | 1,575 | 12,618 | 3,864 | 20,497 | 79,099 |

**සංඛ්‍යා සටහන iii**



**නිෂ්පාදනය කරන ලද ෂීට් රබර්**



**ටයර් නිෂ්පාදනය**

## 2016 වර්ෂයේ දිස්ත්‍රික්ක වශයෙන් රබර් නිෂ්පාදනය

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් නිෂ්පාදනය මෙ. ටො. | ජාතික නිෂ්පාදනයට දිස්ත්‍රික් දායකත්වය % |
|---|---|---|
| කළුතර | 19379.26 | 24.50 |
| කෑගල්ල | 24528.60 | 31.01 |
| ගම්පහ | 2388.79 | 3.02 |
| කුරුණෑගල | 1700.63 | 2.15 |
| මහනුවර | 972.92 | 1.23 |
| මාතලේ | 806.81 | 1.02 |
| රත්නපුර | 16863.91 | 21.32 |
| ගාල්ල | 4041.96 | 5.11 |
| මාතර | 2721.01 | 3.44 |
| හම්බන්තොට | 31.64 | 0.04 |
| කොළඹ | 4049.85 | 5.12 |
| මොණරාගල | 854.27 | 1.08 |
| බදුල්ල | 656.52 | 0.83 |
| පුත්තලම | 7.91 | 0.01 |
| අම්පාර | 94.92 | 0.12 |
| **එකතුව** | **79099** | **100** |

**සංඛ්‍යා සටහන iv**

### 3.2.2. නිෂ්පාදන වියදම

වියලි රබර් කිලෝ ග්‍රෑමයක් නිෂ්පාදනය සඳහා 2016 වර්ෂයේ කුඩා වතු අංශයේ සාමාන්‍ය නිෂ්පාදන වියදම රු. 180.00 කි. පෙර වර්ෂයේ නිෂ්පාදන වියදම රු. 170.00 කි. වතු සමාගම් සඳහා 2016 වර්ෂයේ නිෂ්පාදන වියදම රු. 286.41 ක් වන අතර, පෙර වර්ෂයේ එම අගය රු.285.00 ක් විය. අස්වැන්න අඩු වීම නිසා නිෂ්පාදන වියදම වැඩි විය යුතුය. එසේ නිෂ්පාදන වියදම 2002 වසරේ සිට වර්ධනය වි ඇති ආකාරය සංඛ්‍යා සටහන් අංක **v** හි දක්වා ඇත.

## රබර් නිෂ්පාදන වියදම 2002 - 2016

*(කි.ග්‍රෑම්1 ක්/රුපියල්)*

| වර්ෂය | වැවිලි සමාගම් | කුඩා වතු අංශය |
|---|---|---|
| 2002 | 55.74 | 54.00 |
| 2003 | 59.76 | 63.30 |
| 2004 | 65.98 | 73.37 |
| 2005 | 72.56 | 77.37 |
| 2006 | 87.65 | 97.20 |
| 2007 | 102.31 | 112.69 |
| 2008 | 119.89 | 114.00 |
| 2009 | 135.83 | 118.56 |
| 2010 | 158.94 | 119.83 |
| 2011 | 188.23 | 129.56 |
| 2012 | 207.00 | 136.00 |
| 2013 | 245.00 | 150.00 |
| 2014 | 280.00 | 160.00 |
| 2015 | 285.00 | 170.00 |
| 2016 | 286.41 | 180.00 |

**සංඛ්‍යා සටහන V**

**රබර් නිෂ්පාදන වියදම 2002 - 2016**



## 3.3. දේශීය රබර් පරිභෝජනය

මෙරට නිෂ්පාදිත ස්වභාවික රබර් අතීතයේ දී ප්‍රධාන වශයෙන් අපනයනය මත පදනම් වූ වැදගත් කාර්මික අමු ද්‍රව්‍යයක් ලෙස පැවති අතර, වර්තමානය වන විට එම තත්ත්වය ක්‍රමිකව වෙනස් වී දේශිය නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් රබර් භාවිතා කිරීමේ නැඹුරුතාවයක් දැක ගත හැකිය. ඒ අනුව 2016 වර්ෂයේදී දේශීය පරිභෝජනය ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් 141940 ක් විය. මෙම වර්ෂයේ රබර් නිෂ්පාදනය ගිය වසරට වඩා අඩු වී ඇති බැවින් පසුගිය වසරේ රබර් තොග වලින්ද දේශීය පරිභෝජනය හා අපනයනය සඳහා මේ වසරේදී යොදාගෙන ඇත. මෙම වර්ෂයේ ආනයනය කරන ලද රබර් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 72985 කි. මෙම ප්‍රමාණයද දේශීය රබර් පරිභෝජනය සඳහා යොදාගෙන ඇත.

## 3.4. අමු ද්‍රව්‍යයක් ලෙස ස්වාභාවික රබර් අපනයනය

පසුගිය 2015 වසර සමග සන්සන්දනය කිරීමේදී 2016 වර්ෂයේ ලංකාවේ රබර් අපනයනයේ කැපී පෙනෙන වැඩි වීමක් සිදු වී ඇත.

**2015 සහ 2016 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන්**

| මාසය | නැව්ගත කළ ප්‍රමාණයන් (මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | 2015 වර්ෂය | 2016 වර්ෂය |
| ජනවාරි | 875 | 1245 |
| පෙබරවාරි | 961 | 1367 |
| මාර්තු | 1001 | 1495 |
| අප්‍රේල් | 1102 | 1344 |
| මැයි | 1067 | 1207 |
| ජූනි | 964 | 930 |
| ජූලි | 713 | 711 |
| අගෝස්තු | 621 | 1008 |
| සැප්තැම්බර් | 803 | 1142 |
| ඔක්තෝබර් | 751 | 1935 |
| නොවැම්බර් | 665 | 2007 |
| දෙසැම්බර් | 850 | 1776 |
| **එකතුව** | 10373 | 16167 |

**සංඛ්‍යා සටහන vi**




**රබර් අපනයනය 2015 සහ 2016**

2015 සහ 2016 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව පහත සටහනේ දක්වා ඇත.

**2015 සහ 2016 වර්ෂයන්හි අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව**

**(මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | සෝල් ක්‍රේප් | ස්ක්‍රැප් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් (T.S.R) | ලේටෙක්ස් සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2015** | 903 | 1847 | 13 | 6888 | 417 | 305 | 10373 |
| **2016** | 1630 | - | 1500 | 10515 | 1141 | 1381 | 16167 |

**සංඛ්‍යා සටහන vii**

මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස (F.O.B) වටිනාකම සටහන **viii** හි දැක්වේ.

**මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස වටිනාකම**

| වර්ෂය | අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් | මුළු වටිනාකම රු.මිලියන | කි.ග්‍රෑම් 1ක වටිනාකම රු. |
|---|---|---|---|
| **2015** | 10373 | 3547.90 | 342.03 |
| **2016** | 16167 | 4758 | 294.33 |

**සංඛ්‍යා සටහන viii**

රබර් අපනයනය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් කරනු ලබයි. පෞද්ගලික අංශයෙහි ලියාපදිංචි අපනයන කරුවන් 120 දෙනෙකු සිටී. එම අපනයනකරුවන් 120 දෙනාම මෙම දෙපාර්තමේ

න්තුවේ 2016 වර්ෂය සඳහා ද ලියාපදිංචි කර ඇත.

**රබර් මිලයට ගන්නා ප්‍රධාන රටවල් 2016**

**(මෙට්‍රික් ටොන්)**

| රට | මිලයට ගත් ප්‍රමාණය | % |
|---|---:|---:|
| පකිස්තානය | 3009 | 19 |
| මැලේසියාව | 2595 | 16 |
| ජපානය | 1525 | 9 |
| ජර්මනිය | 1474 | 9 |
| ඉතාලිය | 1060 | 7 |
| ඇමරිකාව | 882 | 5 |
| ඉන්දියාව | 761 | 5 |
| චීනය | 744 | 4 |
| දකුණු අප්‍රිකාව | 548 | 3 |
| ස්පාඤ්ඤය | 162 | 1 |
| එක්සත් රාජධානිය | 90 | 1 |
| හොංකොං | 85 | 1 |
| වෙනත් | 3232 | 20 |
| **එකතුව** | **16167** | **100** |

**සංඛ්‍යා සටහන ix**

## 3.5. රබර් ආනයනය කල ප්‍රමාණයන් - 2016 වර්ෂය

| මාසය | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---:|
| ජනවාරි | 5845 |
| පෙබරවාරි | 6398 |
| මාර්තු | 3098 |
| අප්‍රේල් | 6495 |
| මැයි | 12947 |
| ජූනි | 7202 |
| ජූලි | 5210 |
| අගෝස්තු | 4482 |
| සැප්තැම්බර් | 4208 |
| ඔක්තෝබර් | 9605 |
| නොවැම්බර් | 4382 |
| දෙසැම්බර් | 3113 |
| **එකතුව** | 72985 |

**සංඛ්‍යා සටහන x**

2015 සහ 2016 වර්ෂයන්හි ආනයනය කළ ස්වභාවික රබර් ප්‍රමාණයන් වර්ග අනුව

(මෙට්‍රික් ටොන්)

| වර්ෂය | ෂීට් රබර් | සෝල් ක්‍රේප් | ස්ක්‍රැප් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් (T.S.R) | ලේටෙක්ස් සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2015 | 38182 | 0 | 0 | 0 | 892 | 15302 | 54,376 |
| 2016 | 51540 | - | - | - | 3152 | 18293 | 72985 |

සංඛ්‍යා සටහන xi

මුළු රබර් ආනයනය - 2016

(මෙට්‍රික් ටොන්)

| වර්ගය | ආනයනය කල ප්‍රමාණය මෙ. ටො. | ආනයන වටිනාකම රු. මි. |
|---|---|---|
| ස්වභාවික රබර් | 72984.91 | 15619.28 |
| කෘතිම රබර් | 69491.34 | 15,351.75 |
| ප්‍රතිසැකසුම් කරන ලද රබර් | 21962.93 | 1978.92 |
| ස්ක්‍රේප් රබර් | 12155.94 | 743.00 |
| සංයුක්ත රබර් | 7530.21 | 2,075.88 |
| අර්ධ නිමි වෙනත් වර්ග | 6549.66 | 765.71 |
| නිමි භාණ්ඩ නිෂ්පාදනය(Kg) | 9582.27 | 8,523.04 |
| නිමි භාණ්ඩ නිෂ්පාදනය (ගණන) | 6787.30 | 12,708.02 |

සංඛ්‍යා සටහන xii

## 3.6. රබර් මිල

ගෝලීය දළ ජාතික නිෂ්පාදනයේ මන්දගාමී වර්ධනය හේතුවෙන් ස්වාභාවික රබර් සඳහා වන ඉල්ලුම අඩු වීම නිසා 2011 වසරේ සිට රබර් මිල අඩු වෙමින් පවතින අතර 2015 හා 2016 වර්ෂ වල රබර් මිල පහත පරිදි වේ.

රබර් වර්ග අනුව සාමාන්‍ය මිල

*(කිලෝ 1ක් රුපියල්)*

| වර්ෂය | වාර්ෂික සාමාන්‍ය මිල | | |
|---|---|---|---|
| | ෂීට් රබර් නො. 1 | ස්ක්‍රැප් ක්‍රේප් නො.1.XBR | ලේටෙක්ස් ක්‍රේප් නො.1X |
| 2015 | 245.93 | 187.74 | 299.17 |
| 2016 | 238.97 | 179.56 | 262.38 |

සංඛ්‍යා සටහන xiii

# 2016 වර්ෂයේ මාසික රබර් මිල

රුපියල්

| මාසය | ෂීට් රබර් (ආර් එස් එස්) | | | | | ලේටෙක්ස් ක්‍රේප් | | | | | ස්ක්‍රැප් ක්‍රේප් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | IX | 1 | 2 | 3 | 4 | 1XBR | 2XBR | 3XBR | 4 | FB | SKIM |
| ජනවාරි | 228.00 | 188.67 | ඉ.නැත | ඉ.නැත | ඉ.නැත | 285.60 | 284.00 | 267.38 | 225.13 | 161.21 | 159.11 | 157.67 | 155.88 | 153.84 | 150.00 | 124.67 |
| පෙබරවාරි | 194.00 | 189.25 | 186.00 | 179.25 | ඉ.නැත | 289.38 | 286.31 | 267.86 | 227.25 | 144.94 | 141.84 | 141.33 | 142.34 | 140.43 | ඉ.නැත | 116.36 |
| මාර්තු | 208.68 | 205.47 | 190.00 | 181.50 | 182.00 | 287.14 | 283.14 | 258.63 | 243.67 | 149.89 | 145.31 | 142.25 | 147.13 | 142.50 | 136.50 | 116.50 |
| අප්‍රේල් | 232.63 | ඉ.නැත. | 230.50 | ඉ.නැත | 212.00 | 278.75 | 276.00 | 252.42 | 227.33 | 179.17 | 169.83 | 164.56 | 166.25 | 159.33 | 155.50 | 126.56 |
| මැයි | 245.33 | 239.00 | 240.00 | ඉ.නැත | ඉ.නැත | 274.01 | 272.17 | 237.25 | 210.67 | 179.17 | 169.29 | 162.75 | 165.70 | 158.98 | 137.00 | 135.63 |
| ජූනි | 268.92 | ඉ.නැත | 255.00 | ඉ.නැත | 232.13 | 270.00 | 262.71 | 226.50 | 205.78 | 181.00 | 172.33 | 167.43 | 162.21 | 157.06 | 135.00 | 134.06 |
| ජූලි | 254.38 | 247.50 | 243.33 | ඉ.නැත | 233.25 | 264.83 | 259.57 | 226.07 | 214.00 | 213.63 | 188.57 | 179.63 | 168.44 | 160.36 | 142.05 | 141.28 |
| අගෝස්තු | 229.33 | 228.47 | 215.50 | 214.00 | 214.50 | 234.71 | 231.00 | 208.75 | 200.10 | 189.81 | 174.33 | 171.80 | 175.11 | 166.78 | 152.00 | 143.58 |
| සැප්තැම්බර් | 225.23 | 221.38 | 218.50 | 216.80 | ඉ.නැත | 222.43 | 218.88 | 205.63 | 193.00 | 175.31 | 172.13 | 171.00 | 170.64 | 162.96 | 152.50 | 132.90 |
| ඔක්තෝබර් | 236.40 | 233.08 | 232.25 | 226.50 | ඉ.නැත | 228.00 | 220.63 | 210.50 | 203.38 | 190.75 | 183.50 | 180.75 | 179.05 | 172.50 | 164.00 | 142.22 |
| නොවැම්බර් | 259.57 | 257.03 | 250.88 | 248.23 | ඉ.නැත | 235.33 | 234.52 | 230.40 | 228.69 | 226.92 | 220.88 | 217.04 | 204.28 | 202.26 | 173.50 | 189.81 |
| දෙසැම්බර් | 285.21 | 283.00 | 283.00 | 297.00 | 284.00 | 278.33 | 275.00 | 269.07 | 265.21 | 266.45 | 257.60 | 252.67 | 242.50 | 240.00 | 219.50 | 223.00 |
| සාමාන්‍ය | **238.97** | **229.28** | **231.36** | **223.33** | **226.31** | **262.38** | **258.66** | **238.37** | **220.35** | **188.19** | **179.56** | **175.74** | **173.29** | **168.08** | **156.14** | **143.88** |

❖ ඉ.නැත - ඉදිරිපත් වී නැත.

## 3.7. රබර් වෙළඳුන්

රබර් වෙළඳාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම නෛතික අවශ්‍යතාවයක් වන අතර 2016 වර්ෂයේ රබර් වෙළඳුන් 850 ක් බලපත්‍ර අලුත් කර ඇති අතර, නව බලපත්‍ර 28 ක් අලුතින් නිකුත් කර ඇත. ඒ අනුව 2016 වර්ෂයේදී රබර් වෙළඳුන් 878 ක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. දිස්ත්‍රික්ක වශයෙන් එම වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම් මෙසේය.

| දිස්ත්‍රික්කය | අලුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | අලුතින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 58 | - |
| ගම්පහ | 31 | - |
| කළුතර | 237 | 04 |
| රත්නපුර | 164 | 08 |
| කෑගල්ල | 270 | 10 |
| කුරුණෑගල | 12 | - |
| මහනුවර | 08 | - |
| මාතලේ | 03 | - |
| ගාල්ල | 30 | 02 |
| මාතර | 25 | - |
| හම්බන්තොට | - | - |
| මොණරාගල | 11 | 04 |
| බදුල්ල | 01 | - |
| **එකතුව** | **850** | **28** |

**සංඛ්‍යා සටහන XV**

## 3.8. රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය

සහනාධාර ක්‍රමය යටතේ රබර් නැවත හෝ අළුතෙන් වගා කිරීම සඳහා 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමේ පනතේ 07 වගන්තිය අනුව අවසර පත්‍රයක් ලබාගත යුතුය. මෙම පනත අනුව සියලුම රබර් ඉඩම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වු රබර් ඉඩමක පවතින වගාවේ වයස අවු 20 ඉක්ම වූ පසු එම ඉඩම සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කිරීම සඳහා බලපත්‍රයක් ලැබීමට සුදුසුකම් ලබයි.

රබර් වගාවේ නිරත වන්නන් තව දුරටත් දිරි ගැන්වීම සඳහා හෙක්ටයාරයකට රු. 125,000 ක් වූ නැවත වගා/ අළුත් වගා සහනාධාර මුදල 2011 වසරේදී පහත පරිදි වැඩි කරන ලදී.

අළුත් වගාව සඳහා හෙක්ටයාරයකට රු. 150,000

නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු. 175,000

මෙම ආධාර මුදල වාරික 08 කින් ගෙවනු ලැබේ. වාරික ගෙවන ආකාරය පහත සටහනේ දැක්වේ.

| **වාරිකය** | **අලුත් වගාව හෙක්ටයාරයකට (මුදල රුපියල් වලින්)** | **නැවත වගාව හෙක්ටයාරයකට (මුදල රුපියල් වලින්)** |
|---|---|---|
| පළමු වාරිකය (1) | 6,000.00 | 8,000.00 |
| දෙවන වාරිකය (2) | 36,000.00 | 43,000.00 |
| තෙවන වාරිකය (3) | 12,000.00 | 15,000.00 |
| සිව්වන වාරිකය (4) | 18,000.00 | 21,000.00 |
| පස්වන වාරිකය (5) | 18,000.00 | 21,000.00 |
| හයවන වාරිකය (6) | 18,000.00 | 21,000.00 |
| හත්වන වාරිකය (7) | 19,000.00 | 22,000.00 |
| අටවන වාරිකය (8) | 23,000.00 | 24,000.00 |
| **එකතුව** | **150,000.00** | **175,000.00** |

**සංඛ්‍යා සටහන xvi**

## 3.9. නව වගාවද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය

රබර් සංවර්ධනය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කරන ලද කාර්යභාරය පහත සඳහන් පරිදි වේ. ඒ අනුව මෙරට රබර් කර්මාන්තය ශක්තිමත් ආර්ථික ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා වයස්ගත වූ, කල් ඉක්මවූ හා ආර්ථික වශයෙන් ඵලදායී නොවන රබර් වගාවන් ඉවත්කොට එම ඉඩම් නැවත වගා කළ යුතු වේ. ඵලදායී වගාවක් පවත්වාගෙන යාම සඳහා මුළු රබර් බිම් ප්‍රමාණයෙන් 3% ක් වත් වාර්ෂිකව නැවත වගා කළ යුතු වේ. එම බිම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 4000 වේ. 2016 වර්ෂයේ ඇස්තමේන්තු ගත නැවත වගා/ අළුත් වගා රබර් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 7000 විය. 2016 වර්ෂයට නැවත වගා කිරීම සඳහා ඉලක්ක බිම් ප්‍රමාණය කුඩා වතු යටතේ හෙක්ටයාර් 2700 සහ වතු සමාගම් යටතේ නැවත වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1500 ක්ද වශයෙන් හෙක්ටයාර් 4200 කි. වර්ෂය තුල අළුත් වගා ඉලක්කය කුඩා වතු යටතේ සම්ප්‍රදායික ප්‍රදේශ වල හෙක්ටයාර් 1800 සහ සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල හෙක්ටයාර් 1000 ක්ද වශයෙන් හෙක්ටයාර් 2800 කි.

නැවත වගා හා අළුත් වගා සහනාධාර ක්‍රමයන් යටතේ වගා කිරීම සඳහා ලැබුණු ඉල්ලුම් පත්‍ර, නිකුත් කල බලපත්‍ර හා නියම වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණයන් සංඛ්‍යා සටහන් xviii හා xix හි සඳහන් වේ.

## රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය

## (කුඩා වතු හිමියන්) 2016 වර්ෂය

*(හෙක්ටයාර්)*

| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | නැවත වගාකළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 479 | 320.23 | 476 | 317.79 | 251 | 151.07 |
| කෑගල්ල | 684 | 478.1 | 506 | 351.13 | 276 | 163.26 |
| ගම්පහ | 100 | 80.89 | 65 | 44.67 | 43 | 28.11 |
| කුරුණෑගල | 14 | 32.59 | 14 | 30.23 | 03 | 7.16 |
| මහනුවර | 28 | 28.85 | 26 | 27.99 | 08 | 5.18 |
| මාතලේ | 01 | 7.91 | 01 | 7.91 | - | - |
| රත්නපුර | 200 | 160.78 | 201 | 167.22 | 114 | 90.42 |
| ගාල්ල | 14 | 11.68 | 13 | 10.97 | 09 | 4.38 |
| මාතර | 25 | 27.48 | 23 | 24.35 | 07 | 4.15 |
| මොණරාගල | 1 | 0.81 | 1 | 0.81 | 1 | 0.81 |
| කොළඹ | 130 | 93.94 | 137 | 108.50 | 108 | 83.46 |
| **එකතුව** | **1676** | **1243.26** | **1463** | **1091.57** | **820** | **538** |

**සංඛ්‍යා සටහන xvii**

**රබර් අළුත් වගා සහනාධාර ක්‍රමය යටතේ වගා කළ බිම් ප්‍රමාණය**
**(කුඩා වතු හිමියන්) 2016**

*(හෙක්ටයාර්)*

| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | අළුතින් වගා කළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 111 | 43.62 | 109 | 42.19 | 64 | 25.65 |
| කෑගල්ල | 295 | 143.54 | 234 | 86.26 | 130 | 46.55 |
| ගම්පහ | 39 | 17.75 | 31 | 13.01 | 28 | 11.87 |
| කුරුණෑගල | 17 | 15.02 | 14 | 12.26 | 07 | 4.58 |
| මහනුවර | 21 | 11.74 | 16 | 6.29 | 11 | 4.32 |
| මාතලේ | 01 | 0.81 | 01 | 0.81 | - | - |
| රත්නපුර | 100 | 57.28 | 82 | 47.99 | 37 | 18.23 |
| ගාල්ල | 23 | 12.16 | 23 | 12.04 | 06 | 4.35 |
| මාතර | 17 | 16.56 | 14 | 14.64 | 06 | 4.74 |
| හම්බන්තොට | 20 | 14.54 | 20 | 12.83 | 08 | 6.36 |
| කොළඹ | 27 | 21.47 | 30 | 22.16 | 15 | 6.49 |
| මොණරාගල | 407 | 240.7 | 394 | 232.99 | 344 | 197.72 |
| බදුල්ල | 78 | 61.10 | 70 | 55.84 | 58 | 49.04 |
| අම්පාර | 203 | 186.19 | 198 | 181.74 | 228 | 212.57 |
| **එකතුව** | **1359** | **842.48** | **1236** | **741.05** | **942** | **592.47** |

**සංඛ්‍යා සටහන xviii**

**රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය (වතු අංශය) 2016**

| ප්‍රාදේශීය කාර්යාලය | වගා කල බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| කළුතර | 71.91 |
| කෑගල්ල | 178.75 |
| ගාල්ල | 17.04 |
| මොණරාගල | 9.27 |
| රත්නපුර | 59.18 |
| **එකතුව** | **336.15** |

**සංඛ්‍යා සටහන xix**



# රබර් නැවත වගා බිම් ප්‍රමාණය 1990-2016

(හෙක්ටයාර්)

| වර්ෂය | කුඩා වතු අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 3584 | 1617 | 5201 |
| 1991 | 3507 | 1794 | 5301 |
| 1992 | 2028 | 1889 | 3917 |
| 1993 | 2419 | 2817 | 5236 |
| 1994 | 1623 | 2138 | 3761 |
| 1995 | 1778 | 1461 | 3239 |
| 1996 | 1983 | 1217 | 3200 |
| 1997 | 1172 | 2045 | 3217 |
| 1998 | 1173 | 2542 | 3715 |
| 1999 | 665 | 3866 | 4531 |
| 2000 | 770 | 1853 | 2623 |
| 2001 | 558 | 4584 | 5142 |
| 2002 | 712 | 2066 | 2778 |
| 2003 | 565 | 494 | 1059 |
| 2004 | 819 | 1264 | 2083 |
| 2005 | 1257 | 2329 | 3586 |
| 2006 | 1122 | 2331 | 3453 |
| 2007 | 993 | 4199 | 5192 |
| 2008 | 812 | 5293 | 6105 |
| 2009 | 1002 | 5360 | 6362 |
| 2010 | 1186 | 4756 | 5942 |
| 2011 | 1123 | 1927 | 3050 |
| 2012 | 1117 | 2126 | 3243 |
| 2013 | 1710 | 2784 | 4494 |
| 2014 | 1343 | 1554 | 2897 |
| 2015 | 614 | 1303 | 1917 |
| 2016 | 538 | 336.15 | 874.15 |

**සංඛ්‍යා සටහන XX**

# රබර් නව වගා බිම් ප්‍රමාණය 1990-2016

(හෙක්ටයාර්)

| වර්ෂය | කුඩා වතු අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 1039 | 258 | 1297 |
| 1991 | 1602 | 202 | 1804 |
| 1992 | 612 | 302 | 914 |
| 1993 | 907 | 135 | 1042 |
| 1994 | 670 | 37 | 707 |
| 1995 | 651 | 45 | 696 |
| 1996 | 1208 | 35 | 1243 |
| 1997 | 793 | 21 | 814 |
| 1998 | 516 | 17 | 533 |
| 1999 | 223 | 48 | 271 |
| 2000 | 243 | 34 | 277 |
| 2001 | 150 | 14 | 164 |
| 2002 | 227 | 7 | 234 |
| 2003 | 451 | 7 | 458 |
| 2004 | 518 | 5 | 523 |
| 2005 | 1032 | 11 | 1043 |
| 2006 | 1603 | 297 | 1900 |
| 2007 | 1701 | 333 | 2034 |
| 2008 | 2755 | 414 | 3169 |
| 2009 | 1994 | 275 | 2269 |
| 2010 | 2857 | 96 | 2953 |
| 2011 | 2166 | 838 | 3004 |
| 2012 | 2297 | 1086 | 3383 |
| 2013 | 2979 | 912 | 3891 |
| 2014 | 1428 | 133 | 1561 |
| 2015 | 769 | 56 | 825 |
| 2016 | 592 | - | 592 |

**සංඛ්‍යා සටහන xxi**

## 3.10. සහනාධාර ගෙවීම්

සමාලෝචනයට භාජනය වන 2016 වසර තුල පහත දැක්වෙන පරිදි ඒ ඒ වගාවන් සඳහා සහනාධාර මුදල් ගෙවීමට දෙපාර්තමේන්තුව සමත් විය.

**රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම්**

| ව්‍යාපෘතිය | ගෙවූ මුදල් එකතුව ( රු.මි. ) |
|---|---|
| 2016 නැවත වගා සහනාධාර (කුඩාවතු) | 192.98 |
| 2016 අළුත් වගා සහනාධාර (කුඩාවතු) | 179.90 |
| 2016 නැවත වගා සහනාධාර (වැවිලි සමාගම්) | 144.53 |
| **එකතුව** | 517.41 |

**සංඛ්‍යා සටහන xxii**

## 3.11. රබර් පැළ තවාන් සහ පැළ සැපයීම්

රබර් වගාව ආරම්භ කිරීමත් සමඟ රබර් වගාව කෙරේ වැවිලි කරුවන්ගේ උනන්දුව අධික විය. මේ නිසා රබර් පැළ ඉල්ලුම නොකඩවා ඉහළ ගියේය. මේ සඳහා පැළ නිෂ්පාදනයට විශේෂ අවධානයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යොමු කෙරිණි. ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ රබර් පැළ තවාන් මෙන්ම පුද්ගලික රබර් පැළ තවාන් ද ආරම්භ කිරීම සිදු කෙරිණි.

පුද්ගලික රබර් පැළ තවාන් හා වාණිජ රබර් පැළ තවාන් පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තුවෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතුය. මූලික අවස්ථාවේදී මෙම තවාන් වල උසස් තත්වයේ බද්ධ අතු තවාන් පිහිටුවා ගැනීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව සතු තවාන් වලින් සපයනු ලබයි.

### 3.11.1. රජයේ පැළ තවාන්

රජයේ තවාන් වල පැළ නිෂ්පාදනය හා පැළ නිකුත් කිරීම-2016

| **තවානේ නම** | **තවාන අයත් වන දිස්ත්‍රික්කය** | **පැළ නිෂ්පාදනය** | **පැළ බෙදාහැරීම** |
|---|---|---|---|
| කරපිංච | රත්නපුර | 52987 | 74923 |
| මීරිගම | ගම්පහ | 90968 | 98539 |
| වැලිකඩමුල්ල | ගම්පහ | 173582 | 160451 |
| ඇගල්ඔය | කළුතර | 225093 | 178742 |
| කුඹුක්කන | මොණරාගල | 411121 | 354471 |
| කිරවාන | අම්පාර | 30606 | - |
| ගුරුගොඩ | කළුතර | 141330 | 132737 |
| මිද්දෙණිය | හම්බන්තොට | 79061 | 37400 |
| **එකතුව** | | **1204748** | **1037263** |

**සංඛ්‍යා සටහන xxiii**




දෙපාර්තමේන්තු පැළ තවාන් වලින් 2016 වසරේදී අපේක්ෂිත පැළ නිෂ්පාදනය පැළ මිලියන 1.65 කි. එයින් වසරේ මුළු පැළ නිෂ්පාදනය පැළ මිලියන 1.20 වූ අතර වසර තුල බෙදා හැරීමට හැකි වූයේ පැළ මිලියන 1.04 ක් පමණි. මෙම දෙපාර්තමේන්තුව විසින් නව රබර් පැළ තවානක් අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාවේ ස්ථාපනය කර ඇත. මේ වන විට එම තවානෙහි පැළ නිෂ්පාදනය ආරම්භ කර ඇත. 2016 වර්ෂයේදී එහි ආරම්භක නිෂ්පාදනය පැළ 30606 කි.

### 3.11.2. පුද්ගලික සහ වාණිජ තවාන් බලපත්‍ර 2016

උසස් තත්වයේ බද්ධ රබර් පැළ වැවිලිකරුවන්ට ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. දෙපාර්තමේන්තු තවාන්වල පැළ නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීම පැළ වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම හා තවාන් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් තවාන් සංවර්ධන කටයුතු රාශියක් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. පුද්ගලික අංශයේ තවාන් ද උසස් පැළ නිෂ්පාදනය සඳහා යොමු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයකි. නිර්දේශිත ආකාරයට පිහිටුවා ඇති පැළ තවාන් සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. බලපත්‍ර නිකුත් කල පුද්ගලික පැළ තවාන් රබර් පර්යේෂණායතනයේ නිරන්තර අධීක්ෂණයට ලක් වන අතර පැළ තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ද ලබාදේ. මෙම පැළ තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යන්නේ දැයි පසු විපරම් කිරීම රබර් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

**පැළ නිෂ්පාදනය ( පුද්ගලික පැළ තවාන්) 2016**

| ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශය | ලියාපදිංචි තවාන් ගණන | පැළ නිෂ්පාදනය | පැළ බෙදාහැරීම |
|---|---|---|---|
| කෑගල්ල | 92 | 386618 | 99793 |
| ගම්පහ | 12 | 23750 | 4163 |
| කළුතර | 07 | 65426 | 30171 |
| මොණරාගල | 01 | 31461 | - |
| ගාල්ල | 06 | 47015 | 8357 |
| මාතර | 01 | 1700 | 1700 |
| රත්නපුර | 07 | 135400 | 36550 |
| කොළඹ | 09 | 213500 | 2900 |
| **එකතුව** | **135** | **904870** | **183634** |

**සංඛ්‍යා සටහන xxiv**

## 3.12 අතුරු බෝග වගාව

රබර් සමග අතුරු බෝග වගා කරන කුඩා ඉඩම් හිමියන් සඳහා රබර් පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත අක්කරයකට රු 4000.00 බැගින් සහනාධාර ගෙවීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. මේ අනුව 2016 වර්ෂයේ දී අතුරු බෝග සහනාධාර වශයෙන් රු.මි. 1.20 ක මුදලක් ගෙවන ලදී.



රබර් සමඟ කෙසෙල් වගා කළ ඉඩමක්

**2016 වර්ෂයේ අතුරු බෝග වගාකල බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | වගාකල බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කල ගොවීන් සංඛ්‍යාව |
|---|---:|---:|
| කෑගල්ල | 31.26 | 23 |
| ගම්පහ | 24.83 | 26 |
| කුරුණෑගල | 7.30 | 07 |
| මහනුවර | 1.11 | 04 |
| කළුතර | 23.02 | 30 |
| රත්නපුර | 3.37 | 03 |
| කොළඹ | 45.16 | 52 |
| ගාල්ල | 0.81 | 01 |
| හම්බන්තොට | 2.53 | 05 |
| මොනරාගල | 44.11 | 62 |
| **එකතුව** | 183.50 | 213 |

**සංඛ්‍යා සටහන XXV**




## 3.13. වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම

පරිනත රබර් වගා ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා රබර් වගාකරුවන් වැහි ආවරණ භාවිතයට උනන්දු කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. සාර්ථක වැහි ආවරණ යොදා ඇති ගසකට ඒ සඳහා වැයවන මුදලින් 50% එනම් රු. 30 ක මුදලක් සහනාධාර වශයෙන් ගෙවනු ලබයි.

කුඩා වතු හා වැවිලි සමාගම් සඳහා මේ යටතේ සහනාධාර ගෙවීම් කරන ලදී. මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**වැහි ආවරණ යෙදීම**

| අංශය | වැහි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.) | සහනාධාර වශයෙන් ගෙවූ මුදල රු. මි. |
|---|---|---|
| කුඩා වතු | 182.65 | 2.69 |
| වැවිලි සමාගම් | 2452.52 | 20.34 |
| **එකතුව** | 2635.17 | 23.03 |

**සංඛ්‍යා සටහන xxvi**

### 3.13.1. වැහි ආවරණ යෙදීම දිස්ත්‍රික්ක වශයෙන්

| දිස්ත්‍රික්කය | වැවිලි සමාගම් (හෙක්.) | වැහි ආවරණ යෙදූ වැවිලි සමාගම් ගණන | කුඩා වතු (හෙක්.) | වැහි ආවරණ යෙදූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රත්නපුර | 73.39 | 01 | 60.98 | 15 |
| කොළඹ | - | - | 24.10 | 06 |
| කෑගල්ල | 1840.52 | 01 | 51.97 | 28 |
| ගම්පහ | - | - | 4.56 | 06 |
| කුරුණෑගල | 355.71 | 01 | - | - |
| මහනුවර | - | - | 2.02 | 03 |
| ගාල්ල | 9.88 | 01 | 3.69 | 01 |
| මාතර | - | - | 14.53 | 11 |
| කළුතර | 173.02 | 01 | 20.80 | 08 |
| **එකතුව** | **2452.52** | **05** | **182.65** | **78** |

**සංඛ්‍යා සටහන xxvii**

## 3.14. රබර් වගාව සඳහා පොහොර සහනාධාර ලබාදීම

පසුගිය වසර කිහිපය තුලදී ලෝක රබර් මිල පහත වැටීම හේතුවෙන් ලෝක රබර් නිෂ්පාදනය ද පහත වැටී ඇත. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ද රබර් නිෂ්පාදනය පහත අගයක් ගත්තේය. මේ නිසා රබර් ගොවීන් රබර් වගාවට යොමුවීම අඩුවිය. එබැවින් රබර් ගොවීන් රබර් වගාව කෙරෙහි යොමුකරවා ගැනීම සඳහා රබර් සඳහා පොහොර සහනාධාර වැඩසටහනක් රජය විසින් 2016 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. මෙම පොහොර සහනාධාරය හෙක්ටයාර 1 ට අඩු කුඩා රබර් ඉඩම් හිමියන් වෙත ලබාදෙන ලදී. ඒ අනුව හෙක්ටයාර 1ක් සඳහා පොහොර සහනාධාරය වශයෙන් රුපියල් 5000.00 ක මුදලක් ලබාදෙන ලදී.

මෙහි ප්‍රගතිය පහත වගුවෙන් දැක්වේ.

| දිස්ත්‍රික්කය | පොහොර සහනාධාර ගෙවූ ගොවීන් ගණන | පොහොර සහනාධාරය ගෙවූ හෙක්. ප්‍රමාණය | පොහොර සහනාධාර ගෙවූ මුදල(රු.මිලි.) |
|---|---|---|---|
| කෑගල්ල | 9136 | 4172 | 20.86 |
| ගම්පහ | 1019 | 498 | 2.49 |
| කළුතර | 8125 | 3550 | 17.75 |
| රත්නපුර | 5630 | 2440 | 12.20 |
| කොළඹ | 1420 | 898 | 4.49 |
| ගාල්ල | 862 | 404 | 2.02 |
| මාතර | 1195 | 592 | 2.96 |
| හම්බන්තොට | 266 | 134 | 0.67 |
| මොණරාගල | 7517 | 4558 | 22.79 |
| කුරුණෑගල | 424 | 234 | 1.17 |
| මහනුවර | 641 | 284 | 1.42 |
| මාතලේ | 36 | 20 | 0.10 |
| අම්පාර | 301 | 246 | 1.23 |
| බදුල්ල | 355 | 190 | 0.95 |
| **එකතුව** | **36927** | **18220** | **90.10** |

**සංඛ්‍යා සටහන xxviii**



මොනරාගල පොහොර සහනාධාර චෙක්පත් ලබාදීම

## 3.15. තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු

1958 අංක 02 දරණ තේ හා රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනත යටතේ ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයක් පිහිටුවනු ලැබ ඇත. හෙක්ටයාර 20 ට වැඩි රබර් වත්තක් හෝ ඉන් කොටසක් කැබලි කැඩීමට හෝ විකිණීමට අවශ්‍ය වූ විට එම මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වේ. මෙහිදී එම ආයතනයෙන් ලැබුණු අයදුම්පත්‍ර සඳහා මැනවින් සුපරීක්ෂණය කර ඉහත කී මණ්ඩලය වෙත නිර්දේශ සඳහා යවනු ලබයි.

මෙම මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ගරු අමාත්‍යවරයා විසින් කරන ලද පත්වීම ප්‍රකාර  රාජකාරි ඉටු කරන ලදී.

## 3.16. අන්තර් ජාතික කටයුතු

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමේ (IRSG) හා ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ **(ANRPC)** සාමාජිකත්වය දරයි. ඒ සඳහා 2016 වර්ෂයේ සාමාජික මුදල වශයෙන් ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයට රු. 1,065,298.10 ක් ද ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමට රු. 6,832,896.01 ක් ද ගෙවා ඇත.

මෙම ආයතනවල සාමාජිකත්වය දැරීමෙන් එකී ආයතනවල ක්‍රියාකාරකම් වලට ඍජුව හා ක්‍රියාශීලීව දායක වීම තුලින් අන්‍යොන්‍ය වශයෙන් රබර් කර්මාන්තයේ උන්නතියට වාසි සහගතතාවයක් උදා කෙරිණි. තවද එකී ආයතනවලට දේශීය රබර් මිල, නිෂ්පාදන හා අලෙවි තොරතුරු, වගා බිම් ප්‍රමාණ, ක්ෂේත්‍රයේ නියැලි සංඛ්‍යාවන් ඇතුළු අවශ්‍ය සියළු තොරතුරු කලට වේලාවට වර්ෂය පුරාම වාර්තා කරන ලදී. එසේම එම ආයතන මගින් සෙසු රටවල තොරතුරුද ලබා ගෙන අදාල පාර්ශවයන් අතර බෙදාහරින ලදී.

පසුගිය වසරේ ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC) වාර්ෂික සමුළුව ඉන්දියාවේදී  පැවැත්විණි. ඒ සඳහා ශ්‍රී ලංකාව, ඉන්දියාව, කාම්බෝජය, තායිලන්තය, වියට්නාමය, ඉන්දුනීසියාව, මලයාසියාව, චීනය, පිලිපීනය, පැපුවානිව්ගිනියාව සහ සිංගප්පූරුව යන සාමාජික රටවල් සහභාගි විය.

මෙම සමුළුවේදී ඉදිරි වසර සඳහා සභාපතිත්වය කාම්බෝජයට හිමි විය.

## 3.17. නෛතික කටයුතු

රබර් නැවත වගා කිරීම පිණිස සහනාධාර පනත යටතේ රබර් වගා අවසර පත්‍රයක් මත ආධාර ලබාගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම සියළුම ආධාර මුදල් ලබාගෙන නිම කරන තුරු වගාව හොඳින් පවත්වා ගෙන යෑමට සහ අවශ්‍ය වැඩ කටයුතු කිරීමට සහනාධාර නියෝග අනුව බැඳී සිටී. අවසර පත්‍ර දරන්නන් ඔවුන්ගේ වගාව නොසලකා හරින්නේ නම් සහ අවසන් ආධාර වාරිකය

ලබාගන්නා තෙක් වගාව හොඳින් පවත්වාගෙන නොයන්නේ නම් ලබාගෙන ඇති ආධාර මුදල් දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට නියෝග කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අදාල පනත අනුව ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගවල විධි විධාන පරිදි ආධාර ලබන ඉඩමක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසර රහිතව අන්සතු කළ නොහැක.

මේ අනුව අවසර පත්‍රයේ වලංගු කාල සීමාව දීර්ඝ කර අවසර පත්‍ර දරන්නන්ට වගාව සම්පූර්ණ කිරීමට තරම් අවශ්‍ය කල් ලබාදී රබර් නැවත වගා සහනාධාර පනතේ පරමාර්ථ ඉටු නොවන අයුරින්, සාර්ථකව රබර් වගාවක් පවත්වාගන යාමට අපොහොසත් වන (සහනාධාර ලබාගත්) ඉඩම් හිමියන්ට, ලබාගත් ආධාර ආපසු ගෙවීමට දන්වනු ලැබේ. එසේ නොගෙවන ඉඩම් හිමියන්ට අවසන් පියවරක් වශයෙන් නඩු පවරනු ලැබේ.

**අසාර්ථක වගා අය කිරීම් - 2016 වර්ෂය**

| දිස්ත්‍රික්කය | අයකරගත් වගාකරුවන් සංඛ්‍යාව | අය කර ගැනීමට ඇති සම්පූර්ණ මුදල (රු.) | අවසන් නිවේදන යවා අය කරගත් මුදල (රු.) | නඩු පවරා අය කර ගත් මුදල (රු.) | අය කර ගැනීමට ඉතිරිව ඇති වගා කරුවන් සංඛ්‍යාව | අය කර ගැනීමට ඇති මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| ගාල්ල | 14 | 4,414,126.82 | 113,106.90 | - | 303 | 4,301,019.92 |
| මාතර | 48 | 3,226,351.43 | 262,905.58 | - | 170 | 2,963,445.85 |
| හම්බන්තොට | 16 | 717,793.56 | 62,388.88 | - | 52 | 655,404.68 |
| කොළඹ | 1 | 185,592.17 | 19,627.69 | - | 09 | 165,964.48 |
| රත්නපුර | 10 | 763,052.17 | 123,364.02 | - | 33 | 639,688.15 |
| කළුතර | 20 | 754,785.11 | 515,946.71 | - | - | 238,838.40 |
| මොණරාගල | 01 | 25,200.00 | 25,200.00 | - | - | - |
| බදුල්ල | 01 | 13,200.00 | 13,200.00 | - | - | - |
| අම්පාර | 02 | 49,920.00 | 49,920.00 | - | - | - |
| කෑගල්ල | 34 | 940,770.37 | 244,575.26 | 15,000.00 | 30 | 681,195.11 |
| ගම්පහ | 02 | 229,987.74 | 229,987.74 | - | - | - |
| කුරුණෑගල | 01 | 53,810.50 | 53,810.50 | - | - | - |
| **එකතුව** | 150 | **10,619,804.76** | **1,714,033.28** | **15,000.00** | **597** | **9,645,556.59** |

**සංඛ්‍යා සටහන xxix**

තවද දේශගුණික හා වෙනත් සාධාරණ හේතු මත වගාවන් අසාර්ථක වූ ගොවීන් සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරමින් නැවත වගා උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබා සහනාධාර මුදල් කපා හැරීමට කටයුතු කරනු ලැබේ.

## 3.18. විශේෂ සංවර්ධන වැඩසටහන්

### 3.18.1 අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම

2012 අයවැය යෝජනා අනුව අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීමට ගත් තීරණය අනුව හෙක්ටයාර 10,000 ප්‍රමාණයක රබර් වගා කිරීමට ඉලක්ක කොට ඇත. මෙහි මූලික පියවර වශයෙන් 2012 වසරේදී හෙක් 550 ක රබර් වගා ඉලක්කයක් පැවති අතර වසර අවසාන වන විටදී හෙක් 137.5 ක රබර් වගා කරන ලදී. මහඔය, පදියතලාව, උහන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ටම බෙදී යන ආකාරයට රබර් වගා වැඩසටහන ව්‍යාප්ත වී පවතී.

එහි දෙවන පියවර වශයෙන් 2013 වසරේදී හෙක් 402.93 වගා කරන ලදී. එහි තුන් වන පියවර වශයෙන් 2014 වර්ෂයේදී හෙක්. 256.17 ක් වගා කරන ලද අතර 2015 වරෂයේ දී හෙක්ටයාර 400.29 වගා කරන ලදී. එසේම 2016 වසරේ වගා කරන ලද බිම් ප්‍රමාණය වූයේ හෙක්ටයාර 212.57 කි. ඒ අනුව මේ දක්වා හෙක්ටයාර 1409.46 ක් වගාකර ඇත.

## 3.19. ඒකාබද්ධ අරමුදල

| වියදම් විෂය | මුළු ප්‍රතිපාදන ලැබීම් රු. | ශුද්ධ වියදම් රු. |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| වැටුප් හා වේතන | 243,698,000 | 229,669,274.31 |
| ගමන් වියදම් | 9,240,000 | 9,191,057.63 |
| සැපයීම් | 6,060,000 | 5,766,889.23 |
| නඩත්තු වියදම් | 5,900,000 | 5,039,183.83 |
| ගිවිසුම් ගත සේවා | 31,600,000 | 30,576,806.93 |
| ඉන්ධන | 3,500,000 | 3,499,747.49 |
| සම්මාදම් දායක මුදල් | 13,800,000 | 13,773,244.18 |
| දේපළ ණය පොළී | 1,500,000 | 1,349,209.05 |
| **එකතුව** | 315,298,000 | 298,865,412.65 |

| | | |
|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 16,500,000 | 15,093,868.08 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 12,000,000 | 11,620,548.85 |
| සංවර්ධන සහායන් | 1,000,000,000 | 710,831,106.74 |
| හැකියා වර්ධනය | 1,000,000 | 995,516.00 |
| වෙනත් ආයෝජන | 40,000,000 | 35,131,787.03 |
| **එකතුව** | **1,069,5000,000** | **773,672,826.70** |
| **මුළු එකතුව** | **1,384,798,000** | **1,072,538,239.35** |

**සංඛ්‍යා සටහන xxx**

## 3.20. සෙස් ලැබීම් සහ එය අය කරන ආකාරය

රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගෙන් එම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වශයෙන් මිලදී ගන්නා අමු රබර් සඳහා සෙස් බදු අය කරනු ලැබේ.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝග වලට අනුව එම අමු රබර් කි. ග්‍රෑ 1 ක් සඳහා රු 4/- බැගින් සෙස් බද්දක් අය කරනු ලැබේ. එම බද්ද "අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව" නමින් ලියන ලද චෙක්පත් මඟින් ගෙවනු ලැබේ. ඒ සමඟ අදාල මාසයේ මිලදී ගත් අමු රබර් ප්‍රමාණය දැක්වෙන මාසික මිලදී ගැනීම් වාර්තාවක් (Rcess 4A) අදාල කර්මාන්තකරුවාගෙන් ලබා ගැනේ.

(1) ලියාපදිංචිය

| | |
|---|---|
| ලියාපදිංචි ආයතන ගණන | 153 |
| ගෙවිය යුතු මුළු සමාගම් ගණන | 56 |
| සෙස් ගෙවන සමාගම් ගණන | 49 |
| ලියාපදිංචි අපනයන කරුවන් ගණන | 120 |

**දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බද්ද**

| අදාල මාසය | ආදායම (දේශීය පරිභෝජනය අනුව) රු. මිලි. |
|---|---|
| ජනවාරි | 7.55 |
| පෙබරවාරි | 12.07 |
| මාර්තු | 11.46 |
| අප්‍රේල් | 21.85 |
| මැයි | 9.10 |
| ජූනි | 10.01 |
| ජූලි | 8.42 |
| අගෝස්තු | 20.16 |
| සැප්තැම්බර් | 13.49 |
| ඔක්තෝම්බර් | 20.35 |
| නොවැම්බර් | 17.03 |
| දෙසැම්බර් | 19.86 |
| **එකතුව** | 171.35 |

**සෙස් බදු සංඛ්‍යා සටහන xxxi**

රබර් ආනයනය හා අපනයනය මත අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර මෙසේය.

**ආනයන හා අපනයන මත අය කළ සෙස් බද්ද 2016**

| අදාල මාසය | ආනයනය මත රු.මිලි. | අපනයනය මත රු.මිලි. |
|---|---|---|
| ජනවාරි | 198.2 | 6.9 |
| පෙබරවාරි | 189.2 | 8.2 |
| මාර්තු | 170.4 | 10.9 |
| අප්‍රේල් | 230.6 | 11.9 |
| මැයි | 248.7 | 10.0 |
| ජූනි | 199.0 | 5.5 |
| ජූලි | 218.7 | 3.1 |
| අගෝස්තු | 252.2 | 5.0 |
| සැප්තැම්බර් | 238.5 | 6.9 |
| ඔක්තෝම්බර් | 217.8 | 8.8 |
| නොවැම්බර් | 206.3 | 9.0 |
| දෙසැම්බර් | 255.2 | 7.8 |
| **එකතුව** | **2624.8** | **94** |

**සෙස් බදු සංඛ්‍යා සටහන xxxii**

## 3.21. නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය

1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනතේ 10 වන වගන්තිය සහ 1956 අංක 11 දරණ රබර් පාලන පනතේ 40 හා 41 යන වගන්ති වලට අනුකූලව මෙම මණ්ඩලය ස්ථාපනය කොට ඇත.

මෙම මණ්ඩලය රබර් නැවත වගා සහනාධාර පනත සම්බන්ධව පැන නැගෙන කරුණු පිළිබඳ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම සහ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය පරිපාලනය කිරිම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයාට උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

මෙහි සභාපති නිල බලයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වේ. ඉතිරි සාමාජිකයින් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි.

## 3.22. අභ්‍යන්තර විගණන කටයුතු

- සහතික මිල ගෙවීම් පරීක්ෂාව -M.D.S රබර් ස්ටෝර්ස්
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - නෙලුන්දෙනිය රබර් ස්ටෝර්ස්
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - ඇරෝමා ට්‍රේඩර්ස්
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - T.K ට්‍රේඩර්ස්
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - මැරංගෝනි සමාගම
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - R.A. M.L රණසිංහ
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - චතුරංග රබර් ස්ටෝර්ස්
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - කිරිඇල්ල රබර් ස්ටෝර්ස්
- රබර් සංවර්ධන නිලධාරි කාර්යාලය විවෘත නොකිරීම - රබර් සංවර්ධන නිලධාරී, ඇගල්ඔය
- සෙස් බදු ගෙවිය යුතු ආයතනයක් වශයෙන් හඳුනා ගැනීම - ස්ටාර්කෝ ලංකා ආයතනය
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - කිරිඇල්ල රබර් ස්ටෝර්ස් ( 2015 ජුලි - සැප්තැම්බර් )
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - ලෝඩ්ස්ටාර් පුද්ගලික සමාගම
- දෙපාර්තමේන්තුවට මූල්‍යමය අඩුපාඩු සිදුවන ආකාරයෙන් ප්‍රසම්පාදන තීරණ ගනීම - මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව -තල්දූව රබර් ස්ටෝර්ස්
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - කොළඹ රබර් කඩේ ( 2014 දෙසැම්බර් - 2015 පෙබරවාරි )
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - කොළඹ රබර් කඩේ (2015ජුලි - සැප්තැම්බර්)
- සහතික මිල ගෙවීම් පරීක්ෂාව - කොළඹ රබර් කඩේ (LD/KG/798

## 3.23. ප්‍රචාරක අංශය මගින් ඉටු කරන ලද කාර්යන්

**පුහුණු වැඩසටහන්**

**01.** වෘත්තීය මට්ටමේ කිරි කැපුම් ශිල්පී වැඩසටහන තුලින් එවැනි ශිල්පීන් 360 ක් පුහුණු කරන ලදී.

**02.** අස්වනු සහායකයන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ වැඩ සටහන් 117 ක් සාම්ප්‍රදායිකව රබර් වගාකරන ප්‍රදේශයේ පවත්වන ලද අතර වැඩ සටහන් 22 ක් සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල පවත්වන ලදී.

**03.** රබර් පැළ බද්ධ කිරීමේ පුහුණු වැඩසටහන යටතේ වැඩසටහන් 07 ක් දෙපාර්තමේන්තුවේ තවාන් ආශ්‍රිතව පවත්වන ලදී.

**04.** රබර් වගාව හා කර්මාන්තය පිළිබඳ ප්‍රදර්ශන කිහිපයක් විවිධ ස්ථානවල පවත්වන ලදී. එම ස්ථාන හා පවත්වන ලද දිනයන් පහත දැක්වේ.

- **i.** 2016 මැයි මස 15 හා 16 යන දිනයන්හි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
- **ii.** ලෝක පරිසර දිනය නිමිත්තෙන් 2016 ජුනි මස 05 සහ 06 යන දිනයන්හි මොණරාගල කොටවෙහෙර මංකඩ විද්‍යාලයේදී ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
- **iii.** අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ප්‍රදර්ශනයක් 2016 අගෝස්තු මස 29,30 යන දිනයන්හි අම්පාර ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.
- **iv.** 2016 අගෝස්තු මස 08,09,10, 11 යන දිනයන්හි කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේදී ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
- **v.** ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේදී ප්‍රදර්ශනයක් 2016 සැප්තැම්බර් මස 08 වන දින සිට 10 වන දින දක්වා පවත්වන ලදී.
- **vi.** 2016 සැප්තැම්බර් මස 25 වන දින මොණරාගල පුස්තකාල ශ්‍රවණාගාරයේදී ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
- **vii.** 2016 ඔක්තෝම්බර් මස 09,1011 යන දිනයන්හි ඇඹිලිපිටිය මහජන බුද්ධි මණ්ඩපයේදී ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

**05.** ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය හා මත් ද්‍රව්‍ය නිවාරණ ආයතනය සමඟ ඒකාබද්ධව වැඩ සටහන් රාශියක් රබර් වගා කරන ප්‍රදේශවල පවත්වන ලදී.

**06**. රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පුහුණු වැඩසටහන් රාශියක් රබර් සංවර්ධන නිළධාරී කොට්ඨාශ 7 ක පවත්වන ලදී.

**07.** වැසි ආවරණ භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් රබර් සංවර්ධන නිළධාරී කොට්ඨාශ 16 ක පවත්වන ලදී.

**08.** රබර් කර්මාන්තයේ නියැලී සිටින ගොවීන්ගේ ආකල්ප වර්ධනය කිරීම සඳහා වැඩසටහන් රාශියක් රබර් සංවර්ධන නිළධාරී කොට්ඨාශ 14 ක පවත්වන ලදී.

**09**. නවක රබර් සංවර්ධන නිළධාරීන් සඳහා නේවාසික පුහුණු පාඨමාලාවන් අවස්ථා දෙකකදී පවත්වන ලදී.

**10**. පැරණි රබර් සංවර්ධන නිළධාරීන් සඳහා පාඨමාලාවක් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේදී පවත්වන ලදී.

**11.** පුවත්පත් දැන්වීම් කිහිපයක් පළ කරන ලදී.

**i.** 2016.09.25 දිවයින පුවත්පතේ වැව්ලිසවිය ගමින් ගමට ප්‍රජා සත්කාර ජංගම සේවය පිළිබඳ වර්ණ 04 කින් පිටු ½_ක දැන්වීමක් පළ කරන ලදී.

**ii.** 2016.09.27 දින රාජ්‍ය පොහොර සහනාධාරය පිළිබඳව ලංකාදීප පුවත්පතේ වර්ණ 04 කින් පිටු ½_ක දැන්වීමක් පළ කරන ලදී.

**12**. 2016 වර්ෂයේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සහයෝගය ඇතිව රබර් කර්මාන්තයේ සංවර්ධනය හා ව්‍යාප්තිය උදෙසා වාර්තාමය වීඩියෝ චිත්‍රපටියක් නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනය කරවා ගැනීම, ස්ථාන පරීක්ෂාව ආදී මූලික කටයුතු සිදුකරන ලදී;

## 3.24. පරිගණක අංශය මගින් ඉටු කරන ලද කාර්යන්

- රබර් තොරතුරු කළමනාකරණ පද්ධති ව්‍යාපෘතියේ මෘදුකාංග සංවර්ධනය සිදු කරනු ලබන Price Water House Coopers පුද්ගලික ආයතනය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් ව්‍යාපෘති කටයුතු සාර්ථකව මෙහෙය වීම.

- ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල අවශ්‍යතාවයන්ට අනුකූලව වර්ෂය තුල පරිගණක හා උපාංග මිලදී ගැනීම් සිදු කිරීම.

- දෙපාර්තමේන්තුවේ රබර් පොහොර සහනාධාර ගෙවීම සඳහා ක්‍රියාත්මක වන නව ක්‍රමවේදයට අනුකූලව මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කිරීම, ප්‍රාදේශීය කාර්යාලවල මෘදුකාංග ස්ථාපනය හා පුහුණු කටයුතු, ඉහළ කළමනාකාරීත්වය වෙත අවශ්‍ය වාර්තා ලබා දීම ඇතුළු සමස්ථ ක්‍රියාවලිය මෙහෙයවීම.

- දෙපාර්තමේන්තුවේ රබර් වගා සහනාධාර ගෙවීම් සඳහා ක්‍රියාත්මක වන පරිගණක වැඩසටහනෙහි සමස්ත ක්‍රියාවලිය අධීක්ෂණය හා මෙහෙයවීම.

# 4. ප්‍රාදේශීය කාර්යාල ප්‍රගතිය

දිවයිනේ රබර් වගා කරන දිස්ත්‍රික්ක 14 ක සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 5 ක් පිහිටුවා ඇති අතර 2016 වසරේදී එම කාර්යාල අත් කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

## 4.1. රබර් නව වගා ප්‍රගතිය




අම්පාර දිස්ත්‍රික්කයේ වගා ඉලක්කය හෙක්. 500 ක් විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ මහවැලි ඉඩම් නිරවුල් කර ගැනීමට නොහැකි වූ නිසා ලබා දුන් ඉලක්ක කරා ලගා වීමට නොහැකි විය.

## 4.2. රබර් නැවත වගා ප්‍රගතිය



## 4.3. අතුරු බෝග වගා ප්‍රගතිය




## 4.4. වැහි ආවරණ යෙදීම



4.5. කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන




4.6. කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන



## 4.7. බද්ධකරුවන් පුහුණු වැඩසටහන







**ප්‍රාදේශීය කාර්යාල මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම**

# 5. අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් කරන ලද පත්කිරීම් ප්‍රකාර වර්ෂය තුල පහත සඳහන් ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරමින් පැවරුන රාජකාරි ඉටු කරන ලදී.

1) රබර් පර්යේෂණ ආයතනය
2) තුරුසවිය අරමුදල
3) ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව
4) වතු ඉඩම් කැබලි කිරීම පාලනය කිරිමේ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර වලට සහභාගි වීම, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම, තීරණ සඳහා සහාය දීම, අවශ්‍ය එකඟතා සහ අනුමැතීන් පළ කිරීම, කටයුතු විමර්ශනය කිරීම, එකී ආයතනවල ක්‍රියාත්මක වැඩ සටහන් සඳහා දායකත්වය සැපයීම යන කටයුතු මෙහිදී ඉටු කරන ලදී.

මීට අතිරේකව දෙපාර්තමේන්තුවේ සේවාවන් අවශ්‍ය කළ සියලුම අමාත්‍යංශ දෙපාර්මේන්තු, අනකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන පුද්ගලයන්ට ඔවුන් ඉල්ලා සිටි සේවාවන් තොරතුරු හා සහායන් නොඅඩුව ලබාදුණි. පාසැල් ප්‍රදර්ශන සහාය දේශන හා තොරතුරු සහාය. ආයතනවලට හා පුද්ගලයන්ට අවශ්‍ය සංඛ්‍යාත්මක තොරතුරු හා පැහැදිලි කිරීම්, ශිල්පීය උපදෙස් ආදිය ලබාදීම මේ අතර විය.

මේ සේවාවන් හා තොරතුරු ලබාදීම ප්‍රධාන කාර්යාලයේ ප්‍රදේශීය කාර්යාලවල හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේද තවාන් කළමණාකරුවන්ගේද සහයෙන් සිදුවිය.

රහසිගතයි (කෙටුම්පත)

පිඑල්ඒ/සී/ආර්සීඑෆ්/06/16/01

අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

**රබර් පාලන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

රබර් පාලන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1957 අංක 45 දරන රබර් පාලන (සංශෝධිත) පනත මඟින් සංශෝධිත 1956 අංක 11 දරන රබර් පාලන පනතේ (436 අධිකාරය) 39 (අ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

2. මූල්‍ය ප්‍රකාශන

--------------

2.1 මතය

------

පසුව ඉදිරිපත් කරනු ලැබේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු වුවද අරමුදලේ ගිණුම්, දින 107 ක් ප්‍රමාද වී 2017 ජුනි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද රු. 1,864,559 ක් රබර් පාලන අරමුදලෙන් අඩු කර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 635,271 ක් වූ ජංගම වත්කම් 13 ක ශේෂ වර්ෂ 19 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශවල නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවති අතර, ඊට ඇතුළත් රු.287,378 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 239,784 ක් වූ ජංගම බැරකම් විෂයයන් 05 ක ශේෂ වර්ෂ 19 ට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශවල ඉදිරියට ගෙනවිත් තිබූ අතර, ඊට ඇතුළත් රු.222,031 ක ගෙවිය යුතු අත්තිකාරම් නිරවුල් කිරීමටද පියවර ගෙන නොතිබුණි.

2.2.4 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම

---------------------------------------

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා අදාළ කර ගත හැකි කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ස්ථාවර වත්කම් | 985,925 | උපලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛණ |
| (ආ) | ජංගම වත්කම් | 635,271 | උපලේඛණ, වයස් විශ්ලේෂණ,ශේෂ සනාථන හා පොත් පත් |
| (ඇ) | ජංගම බැරකම් | 239,784 | උපලේඛණ, වයස් විශ්ලේෂණ,ශේෂ සනාථන හා පොත් පත් ලේඛණ |

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

----------------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

------------

අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් සමාලෝචිත වර්ෂයට ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

2009 ජූලි 23 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ දී අරමුදල ඈවර කිරීමට නියෝග කර ඇතත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 26 දින දීය. 2016 මාර්තු 17 දින ගත් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඈවරකරුවකු පත්කර තිබුණද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට අනුකූලව අරමුදලේ කටයුතු ඈවර කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක සම්බන්ධ කරගෙන 2017 ජුනි 30 වන විටත් පිළියෙළ කර නොතිබුණි.

3.3 අයවැය ලේඛනමය පාලනය

අරමුදලේ ක්‍රියාකාරීත්වයක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩු පාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් හා ලැබිය යුතු/ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

විගණකාධිපති

රහසිගතයි (කෙටුම්පත)

පීඑල්ඒ/සී/ආර්ආර්එස්එෆ්/06/16/01

අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

**රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

පසුව ඉදිරිපත් කරනු ලැබේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු වුවද අරමුදලේ ගිණුම් දින 107 ක් ප්‍රමාද වී 2017 ජුනි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂයකදී ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු. 70,659,526 ක් අරමුදලින් අඩුකර දක්වනවා වෙනුවට ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම

(අ) ජංගම නොවන වත්කම්

අරමුදල ක්‍රියාකාරීව නොපවතින බැවින් 2014 ජූලි 04 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව අරමුදලේ ශේෂ නිරවුල් කිරීමට පත්කළ කමිටු නිර්දේශ අනුව 2014 වර්ෂයේදී අරමුදල සතුවූ ස්ථාවර වත්කම් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගිණුම්වලින් ඉවත් කර තිබුණි. පවරන අවස්ථාව වනවිටත් වත්කම් පිළිබඳ ලේඛනයක් නොතිබූ අතර දෙපාර්තමේන්තුවට පැවරූ වත්කම් හා එම වත්කම් භාරගත් බවට කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් ගිණුම්වලින් ඉවත්කළ පිරිවැය රු. 63,438,232 ක වත්කම් නිවැරදිව පවරා තිබුණේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ආ) ජංගම වත්කම්

(i). විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ වර්ෂ 19 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන එකතුව රු. 15,220,514 ක් වූ අත්තිකාරම් ගිණුම් 12 ක ශේෂ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු හා ඒවා අයවිය යුතු පාර්ශවයන්ගේ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii). මහා භාණ්ඩාගාරයෙන් සහ රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතුව රු. 17,353,015 ක් අදාල ආයතන විමසීමෙන් තොරව වර්ෂ 19 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට රැගෙනවිත් තිබූ අතර එම ශේෂ සත්‍ය වශයෙන්ම ලැබිය යුතු ශේෂද යන්න තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(iii). වර්ෂ 19 ක් තිස්සේ ගිණුම්වල දැක්වූ රු. 102,890 ක ලැබිය යුතු ආයෝජන පොලිය 2015 දෙසැම්බර් 31 දිනටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(iv). සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලැබීම් සහ ව්‍යාපෘති අංක 02 යන ගිණුම් දෙකට අදාල පිළිවෙලින් රු. 3,647,219 ක හා රු. 65,477,579 ක ශේෂ පිළිබඳව ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(v). වත්කමක් ලෙස හඳුනාගැනීමට හේතු අපැහැදිලි වූද, අයකර ගැනීම සම්පූර්ණයෙන්ම අවිනිශ්චිත වූද එකතුව රු.351,353 ක් වූ ගිණුම් 5 ක ශේෂද වර්ෂ 19 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) ජංගම බැරකම්

------------------

(i). වර්ෂ 19 කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණු රු.9,988,530 ක විවිධ තැන්පතුවලට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii). ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති වර්ෂ 19 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන රු. 57,526 ක වෛද්‍යාධාර ණය හා වෙනත් දෙපාර්තමේන්තු ණය රු. 416,313 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii). එකම කළමනාකරණයක් යටතේ පැවතියද, රබර් පාලන අරමුදලට ගෙවිය යුතු රු. 281,210 ක් හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.15,449 ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv). ගෙවිය යුතු නිශ්චිත පාර්ශවය හා වටිනාකම හඳුනාගෙන තිබුණද, රු.22,087 ක් රබර් පර්යේෂණායතනයට ගෙවා නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(v). වර්ෂ 19 කට පෙර සිට කිසිදු සේවකයකු සේවයේ යොදවා නොමැති නමුත් ගෙවිය යුතු නිශ්චිත පාර්ශවයක් සඳහන් නොවන රු.90,706 ක සේවක පාරිතෝෂික බැඳීමක් ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(vi). පැල අත්තිකාරම් සහ පරිනත වගාවට පොහොර යනුවෙන් නම් කළ, පිළිවෙලින් රු.119,550 ක් හා රු.4,779,564 වූ ශේෂ දෙකක් වර්ෂ 19 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන අතර ඒවාට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(vii). අරමුදලට අයත් නොවන ණය ලැබීම් යනුවෙන් සඳහන් රු.3,096,701 ක් ජංගම බැරකමක් ලෙස දක්වා තිබුණද, එම අසාමාන්‍ය බැඳීම ඇතිවීමට හේතුව හෝ එම මුදල් ගෙවිය යුතු පාර්ශව කවරේද යන්න පිළිබඳ තොරතුරු හෝ විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් සමාලෝචනය

#### 3.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

2009 ජූලි 23 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ දී අරමුදල ඇවර කිරීමට නියෝග කර ඇතත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 26 දින දිය. 2016 මාර්තු 17 දින ගත් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඇවරකරුවකු පත්කර තිබුණද ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට අනුකූලව අරමුදලේ කටයුතු ඇවර කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක සම්බන්ධ කරගෙන 2017 ජූනි 30 වන විටත් පිළියෙළ කර නොතිබුණි.

## 4 පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂනය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් හා ලැබිය යුතු/ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ජී/සී/ආර්ඩීඩී/16/1 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

**ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂය සඳහා වූ 2016 දෙසැම්බර් **09** දිනැති අංක **252/2016** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ජී 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන **(i)** සිට සටහන **(iv)** දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2016 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2016 අංක **23** දරන විසර්ජන (සංශෝධන ) පනතින් සංශෝධිත 2015 අංක **16** දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2016 දෙසැම්බර් **09** දිනැති අංක **252/2016** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**2.** <u>විගණන විෂය පථය</u>

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන 2016 අංක **23** දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2015 අංක 16 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කලේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම විසර්ජන ගිණුමේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

3. **විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 125 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට පැවරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

4. **විගණන නිරීක්ෂණ**

2016 වර්ෂය සඳහා ශීර්ෂ 293 දරන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයේ සිට 4.11 ඡේදය දක්වා වූ කරුණු දැක්වීම්වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**4.1 අධි ඇස්තමේන්තු කිරීම්**

---------------------------

සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධන වැය විෂයන් 06 ක් වෙනුවෙන් සලසා තිබූ එකතුව රු.1,047,200,000 ක ප්‍රතිපාදනයෙන් රු. 293,332,801ක් ඉතිරි වී තිබුණි. එය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.8 සිට සියයට 33.57 ක් දක්වා පරාසයක විය.

**4.2 මුදල් රෙගුලාසි 66 මාරු කිරීම්**

-------------------------------

(අ) 2016 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රතිපාදන් වලින් අවස්ථා 4 කදී එකතුව රු. 7,100,000 ක් මු.රෙ. 66 මගින් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබීමෙන් එම වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 293-2-1-1205 වැය විෂයයට මුදල් රෙගුලාසි 66 අනුව රු. 60,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුනද, එහි රු. 42,790 ක ඉතිරියක් තිබුණු බැවින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

**4.3 පරිපූරක ප්‍රතිපාදන**

(අ) 2015 ජූලි 29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2015 අනුව අයවැය ඇස්තමේන්තු පිළියෙළ නොකිරීම නිසා වැය විෂයයන් 4ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන ලෙස රු. 18,400,000 ක් ලබාගෙන තිබුණි.

(ආ) 1203 වැය විෂයයට රු. 600,000 ක අතිරේඛ ප්‍රතිපාදන ලබාගෙන තිබුණද ඉන් රු. 221,886 ක් ඉතිරි වී තිබුණි.

**4.4 විසර්ජන ගිණුම හා භාණ්ඩාගාර සටහන් අතර වෙනස්වීම්**

විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ.6 (1) හි ඇතුළත් 2202 සහනාධාර විෂය යටතේ ඉතිරිය රු. 289,168,893 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිතයේ රු. 287,160,877 ක් ලෙස සඳහන් වී තිබුණි.

**4.5 බැරකම් සඳහා බැඳීම්**

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පවත්නා ඉතිරිවීම් ඉක්මවා අවස්ථා 7කදී රු.1,945,188ක බැරකම් ඇතිකරගෙන තිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා ශූන්‍යපාදක අයවැය ක්‍රමය අනුගමනය කර තිබුණ ද 293-2-1-2202 වැය විෂය සඳහා රු. 49,451,619 ක බැරකමකට බැඳී තිබුණි.

**4.6 භාණ්ඩ සමීක්ෂණය**

i. 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 මාර්තු 31 දින රජයේ විගණන අංශය වෙත භාර දී තිබුණි. භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ ඌණතාවයන් වාර්තා වී තිබූ නමුත් ඌණතාවයන්/ අතිරික්තයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි ඇතිවීමට හේතු අනාවරණය කර නොගත් අවස්ථා නිරීක්ෂණය විය.

ii. කෑගල්ල වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තා මගින් නිල නිවාස 04ක භාණ්ඩ වර්ග කිහිපයක් සොරකම් කර ඇති බව හෙළිදරව් කර තිබුණද එහි අලාභයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

iii. මතුගම හා වරකාපොළ නිල නිවාස 04 ක 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

**4.7 අලාභ හානි**

අලාභ හානි සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඩී.ජී.එස්.ඒ. 7 ආකෘතියේ I කොටස අනුව සමාලෝචිත වර්ෂයේදී අයකරගත් / කපාහල හෝ අත්හල අලාභ හානි රු. 90,034 ක් ලෙස දක්වා තිබුන ද එම අලාභහානි සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීම/ කපා හැරීම හෝ අත්හැරීම හෝ සිදු කර නොතිබුණි.

(ආ) ඩී.ජී.එස්.ඒ. 7 (I) ආකෘතියහි ඇතුළත් ප්‍රකාශයන් දෙකෙහිම රු. 27,245 ක සහ රු. 9,50ක අලාභ හානි වර්ෂයේ සිදු වූ අලාභ හානියක් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2014 ජුනි 30 PD 6026 දරන රථය අනතුරකට ලක්වීම හේතුවෙන් සිදු වූ රු.1,469,274 න් රු.1,092,775 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණ ද ප්‍රතිපූර්ණය නොවූ ප්‍රමාණය අලාභයක් ලෙස සටහන් කර නොතිබුණි.

**4.8 අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය**

---

විසර්ජන ගිණුමේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය 2016 දෙසැම්බර් 31 දිනට රු. 37,759,164 ක් ලෙස දක්වා තිබුණද, අත්තිකාරම් ගිණුමේ රු. 39,799,686 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව වෙනස රු. 2,040,522 ක් වී තිබුණි.

**4.9 නව බැංකු ගිණුම් පිළිබඳ තත්ව වාර්තා**

---

i. කෑගල්ල ලංකා බැංකු ශාඛාවේ බැංකු ප්‍රකාශනයේ දැක්වෙන රු. 2,800 ක ශේෂය මෙම වාර්තාව සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

ii. 2016.12.31 දිනට මාස 6ට වැඩි නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් එකතුව රු. 2,056,707 ක් වූ අතර එම චෙක්පත් 175 සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) අනුව කටයුතු කර නොතිබුණි.

**4.10 ජංගම නොවන වත්කම් සංචලන වාර්තා**

---

2016 ජනවාරි 19 දිනැති SA/MA/MA/C'CULAR දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සටහන I ආකෘතිය සංශෝධනය කර තිබුණත් එම සංශෝධනය අනුව ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**4.11 අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව - 2016**

---

i. අග්‍රිම ගිණුම් ශේෂ දැක්වෙන වාර්තාවේ 2015 වර්ෂයේ හා 2016 වර්ෂයේ අග්‍රිම ශේෂ වෙන වෙනම දක්වනු වෙනුවට 2015 අග්‍රිම ගිණුම් අංකය හා ආරම්භක ශේෂය සමගින් 2016 වර්ෂයේ දක්වා තිබුණි.

ii. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 අග්‍රිම ශේෂය වන රු. 6,696,988/47 ක මුදල 2017 ජනවාරි 25 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. නමුත් ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ ඉතිරිය වූ රු. 27,477 ක මුදල ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කිරීම සිදුකර තිබුණේ 2017 ජනවාරි 27 දිනයේදී බව නිරීක්ෂණය විය.

5 <u>පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් ශීර්ෂ 293 ට අදාලව මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඒ.එච්.එම්.එල්. අබේවර්ධන

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත 1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2. අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව